



Gal-Oya
Plantations (Pvt) Limited

# 2017/18

# වාර්ෂික වාර්තාව

# සංක්ෂේපය

වර්ෂ 1997 සිට අක්‍රියව පැවති
එවකට සීමාසහිත හිඟුරාන සීනි කර්මාන්ත (පුද්ගලික) සමාගම
යළි නඟාසිටුවීම සඳහා වර්ෂ 2007 දී සීමාසහිත ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම
පිහිටුවන ලදී.
ශ්‍රී ලංකා රජය වෙනුවෙන් පොදු ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිසම විසින්
හිඟුරාන සීනි කර්මාන්ත (පුද්ගලික) සමාගම නැවත ප්‍රකෘතිමත් කිරීම සඳහාත්
කර්මාන්ත ශාලාව ආශ්‍රිත ඉඩම් වගාකිරීම සඳහාත් උනන්දුවක් දක්වන
පාර්ශ්වයන්ගෙන් කැමැත්ත විමසා සිටින ලදී.

බ්‍රවුන්ස් සහ සමාගම සහ ලංකා ඔරික්ස් ලීසින් සමාගම මූලිකත්වයෙන් යුතු ව්‍යාපාර
එකමුතුවක් විසින් රාජ්‍ය-පුද්ගලික හවුල් ව්‍යාපාරයක් ලෙස පවත්වාගෙන යාමත්
එමඟින් එවකට අත්හැර දමා තිබූ සීනි කම්හල නැවත පණගැන්වීමත් යන අභිප්‍රායයන්
පෙරදැරිකරගෙන ශ්‍රී ලංකා රජය වෙත යෝජනාවක් ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව අධ්‍යයනය කිරීමෙන් අනතුරුව, ශ්‍රී ලංකා රජය හා ඉහත ව්‍යාපාර
එකමුතුව අතර හවුල් ව්‍යාපාරයක් ලෙස නව සංස්ථාවක් ඇරඹුනි.
ඊට අමතරව සීමාසහිත ගල්ඔය (පුද්ගලික) සමූහ ව්‍යාපාරය
එහි පාලක නියෝජිතයා ලෙස පත් කරන ලදී.

හෙක්ටයාර 7,659 කින් යුතු සංස්ථාව සතු භූමි ප්‍රමාණයෙන් වගා කළ හැකි
හෙක්ටයාර 5,200ක් වූ භූමි ප්‍රමාණය පවුල් 4,400ක් අතර බෙදා දී ඇත.
ඉතිරි භූමි ප්‍රමාණය කර්මාන්ත ශාලාවට අයත් ගොඩනැගිලි, නිවාස සංකීර්ණ,
උස්බිම් රක්ෂිත, මාර්ග හා ජලවහන පද්ධති වලින් සමන්විතය. වරිපතන්චේන,
ගල්මඩුව, දීඝවාපිය, හිඟුරාණ සහ නීත්ත වශයෙන් ව්‍යාපෘති බල ප්‍රදේශය
ප්‍රධාන කලාප 05 කට බෙදා ඇත.



Blank page

# අන්තර්ගතය


**දැක්ම හා මෙහෙවර** .................... 01
**මූලික අවධානයට** .................... 03
**සභාපතිතුමාගේ පණිවිඩය** .................... 05
**ප්‍රධාන විධායක නිලධාරීතුමාගේ පණිවිඩය** .................... 07
මූල්‍ය ප්‍රවණතා .................... 09
කොටස් හිමියන්ගේ ආයෝජන .................... 11
අධ්‍යක්ෂ මණ්ඩලය .................... 13
ජ්‍යෙෂ්ඨ කළමණාකාරිත්වය .................... 15
ආයතනික ව්‍යුහය .................... 17
වගා කටයුතු .................... 18
නිෂ්පාදනය .................... 21
කාර්ය මණ්ඩලය .................... 23
ස්කාගාරය .................... 26
අනාගත සැලසුම් .................... 27
අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව .................... 28
අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් පිළිබඳ ප්‍රකාශය.................... 31
විගණන කමිටු වාර්තාව .................... 33


## මූල්‍ය කටයුතු – 2017/18


විගණකාධිපති වාර්තාව .................... 35
ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශය.................... 37
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය .................... 38
හිමිකම් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය .................... 39
මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය .................... 40
මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන් .................... 41
වාර්ෂික මහා සභා රැස්වීමේ නිවේදනය .................... 65
පෙරකලාසි පත්‍රය .................... 66
ආයතනික තොරතුරු .................... 68




# දැක්ම

අපගේ අභිලාෂය වන්නේ ඵලදායීතාව ඉහළ නැංවීම කඩිනම් කිරීම පාර්ශ්වකරුවන්ගේ ඉලක්ක සාක්ෂාත් කරගැනීම සහ හරිත පරිසරයේ පැවැත්මට සහයවෙමින් වෙළඳපළ ප්‍රමුඛයා වීම උදෙසා ශ්‍රී ලංකාවේ උක් කර්මාන්තය යළි නඟා සිටුවීම යි.



# මෙහෙවර

නැගෙනහිර පළාතේ සීනි කර්මාන්තය යළි නඟාසිටුවීම සඳහා මෙන්ම එම ව්‍යාපාරය විවිධාංගීකරණය කිරීමට සහ ඉහළ හා අඛණ්ඩ ආදායමක් උපයා ගැනීම පිණිස පරිසරයට සහාය වන අතරම සංවිධානයේ නිපුණත්වයෙන් ඉහළ, අභිප්‍රේරිත, වෘත්තීය මට්ටමේ, ක්‍රියාශීලී හා ආචාරසම්පන්න කාර්ය මණ්ඩලයක් ගොඩනැංවීම සඳහා හැකි සියලු සම්පත් උපරිම ලෙස භාවිතා කිරීම.



# මූලික අවධානයට

## වගා වපසරිය (හෙක්ටයාර්)




## උක් දඬු අස්වැන්න (මෙ.ටො.)



## මොලැසස් නිෂ්පාදනය (මෙ.ටො.)




## ඇඹරූ උක්දඬු ප්‍රමාණය (මෙ. ටො.)




## සීනි නිෂ්පාදනය (මෙ.ටො.)



**කීර්ති බී. කොටගම**
**සභාපති**
**සීමාසහිත ගල්ඔය වැවිලි**
**(පුද්ගලික) සමාගම**



# සභාපතිතුමාගේ පණිවිඩය

**2018 මාර්තු 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා සීමාසහිත ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගමේ කාර්ය සාධන වාර්තාව ඔබ වෙත ඉදිරිපත් කරනුයේ ඉමහත් සතුටිනි.**

ගල්ඔය වැවිලි සමාගම, 2017/18 මුල්‍ය වර්ෂය අවසන් වන විට උක් දඬු මෙට්‍රික් ටොන් 169,940 ක් භාවිතයෙන් සීනි මෙට්‍රික් ටොන් 12,541 ක් නිෂ්පාදනය කිරීමට සමත් වී ඇත. මෙය අප සැලසුම් කළ ඉලක්කයට වඩා පහළ මට්ටමක පැවතුනි, විශේෂයෙන් උක් වගාවන්වලට රෝග වැළඳීම, අනපේක්ෂිත ගංවතුර දරුණු නියඟය, යනාදී හේතු මත එසේ අස්වැන්න පහත වැටීමට හේතු වූ අතර ප්‍රධාන වශයෙන් සුදු කොළ රෝගය නිසා උක් වල සීනි ප්‍රතිසාදන මට්ටම පහත වැටුණි. මෙම බිඳ වැටීම ගල්ඔය වැවිලි සමාගමට පමණක් නොව, ශ්‍රී ලංකාවේ සමස්ත සීනි කර්මාන්තයට ද බලපාන ලදී. ස්කාගාර බලපත්‍ර ලබා දීම ප්‍රමාද වීම හේතුවෙන් නිෂ්පාදනය කර තිබූ එතනෝල් ලීටර් 500,440 පවා අලෙවි කිරීමට 2018 මාර්තු 31 වන දින වන තෙක් එතනෝල් අලෙවිය සක්‍රීය නොවූ බැවින් 2017/18 වර්ෂය තුල, මුදල් ගලා ඒම රඳා පැවතියේ සීනි අලෙවිය මත පමණි. වර්ෂ 2017 පෙබරවාරි සිට එතනෝල්වලින් මසකට රුපියල් මිලියන 225 ක් සහ දළ වශයෙන් වසරකට රුපියල් බිලියන 2 ක් මෙම ස්කාගාර ව්‍යාපෘතිය මගින් ලැබෙනු ඇතැයි අපි පුරෝකථනය කළෙමු.

1950 දශකයේ අග භාගයේදී රජයේ ව්‍යාපාරයක් ලෙස රට තුළ සීනි කර්මාන්තය ආරම්භ වූ අතර 1990 දශකයේ මැද භාගයේ සිට එය බිඳ වැටෙමින් තිබේ. 1990 දශකයේ මුල් අවධියේදී සීනි අවශ්‍යතාවයෙන් 15% ක් පමණ සපුරා ගැනීමට එයට හැකි වී තිබේ. මේ වන විට ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයට පිළිවෙලින් 100% ක හා 51% ක හිමිකාරිත්වය සහිත ලංකා සීනි සමාගම (පැල්වත්ත හා සෙවනගල සීනි කම්හල්) හා ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම (හිඟුරාන සීනි කම්හල) ට අයත් සීනි කර්මාන්තශාලා තුන මගින් රටේ සීනි අවශ්‍යතාවයෙන් 9% ක් සැපිරීමට දේශීය සීනි කර්මාන්තය දායක වේ. රටේ සමස්ත සීනි (සුදු සහ දුඹුරු) අවශ්‍යතාවය වාර්ෂිකව මෙට්‍රික් ටොන් 700,000 ක් වනු ඇති අතර ඉන් 15% ක් දුඹුරු සීනි වනු ඇතැයි අපි උපකල්පනය කරමු. මෙම කර්මාන්තශාලා වල සාමාන්‍ය දේශීය දුඹුරු සීනි නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 65,000 ඉක්මවයි. දුඹුරු සීනි නිෂ්පාදනයේ වර්තමාන පිරිවැය කිලෝග්‍රෑමයකට රුපියල් 117-157/= අතර වන අතර පසුගිය කන්නයේ දී කිලෝග්‍රෑමයක සීනි සාමාන්‍ය විකුණුම් මිල රුපියල් 98/= කි.

සීනි කර්මාන්තයේ ප්‍රධාන ගැටළු සමහරක් වන්නේ අඩු ඵලදායීතාව, කර්මාන්තශාලා/ස්කාගාර ධාරිතාවන් භාවිතයට ගැනීම සහ මෙහෙයුම් පරිමාණය, ශ්‍රම හිඟය, උක්දඬු, සීනි සහ එහි අතුරු නිෂ්පාදන සඳහා නිසි මිලකරණ යාන්ත්‍රණයක් නොමැතිකම, කර්මාන්තය ආරක්ෂා කිරීම සඳහා ගනු ලබන පියවර සහ නිසි නීතිමය හා ආයතනික රාමුවක් නොමැති වීම යි. 2017/18 මූල්‍ය වර්ෂයේ අවසාන කාර්තුවේදී පැරණි ස්කාගාරය පුළුල් කිරීමෙන් අනතුරුව ගල්ඔය වැවිලි සමාගම ස්කාගාරයේ වාණිජ මෙහෙයුම් ආරම්භ කර තිබේ. වාණිජ බලපත්‍රය 2017 පෙබරවාරි 06 වන දින ලබා දී ඇත.

සීනි සහ උක් පදනම් කරගත් නිෂ්පාදන සහ සම නිෂ්පාදන සඳහා ඇති ඉල්ලුම වැඩිවීම, පොසිල තෙල් මිල ඉහළ යාම, වියළි හා අතරමැදි කලාපවල උක් වගාව සඳහා යෝග්‍ය ඉඩම් සහ දේශගුණය හේතුවෙන් සීනි සහ ආශ්‍රිත කර්මාන්ත ව්‍යාප්ත කිරීම සඳහා විශාල විභවයක් පවතී. විවිධ අගය එකතු කළ නිෂ්පාදන නිපදවීමට හැකියාව සහ ග්‍රාමීය ප්‍රදේශවල කුඩා පරිමාණ කෘෂි-පාදක කර්මාන්ත විවිධාංගීකරණය කිරීමේ යෝග්‍යතාවය, මහා පරිමාණයෙන් සීනි සහ මධ්‍යසාර නිෂ්පාදනය කිරීමට අමතරව ග්‍රාමීය ප්‍රදේශවල සමාජ ආර්ථික තත්ත්වය නඟාසිටුවීම සඳහා කුඩා පරිමාණ ගෘහ කර්මාන්ත ද දියුණු කළ හැකිය. කාබන් වෙළඳාම තුළින් මුදල් සම්පාදනය කිරීමේ ශක්‍යතාව සීනි කර්මාන්තයේ දියුණුවට වාසියකි.

ශ්‍රී ලංකාවේ සීනි සැපයුම ප්‍රධාන වශයෙන් ආනයන වලින් ලැබෙන බැවින් ලෝක වෙළඳපොල තුල පවතින තත්වය දේශීය මිල ගණන් කෙරෙහි වඩා සැලකිය යුතු බලපෑමක් ඇති කරයි. සීනි සඳහා වන ලෝක වෙළඳපොල වඩාත් අස්ථාවර වෙළඳපොලක් වන අතර සාමාන්‍යයෙන් සෑම රටකම පාහේ ප්‍රබල ලෙස රාජ්‍ය මැදිහත්වීම් සිදු වේ.

පසුගිය දශකය තුළ ලෝක මට්ටමේ වාර්තා වූ අඩුම මිල සනිටුහන් කරමින් සීනි මෙට්‍රික් ටොන් එකක මිල ඇමරිකානු ඩොලර් 302 දක්වා පහත වැටීම හේතුවෙන් පසුගිය කන්නයේදී දේශීය සීනි කිලෝග්‍රෑම් එකක මිල රුපියල් 90/= දක්වා පහත වැටුණි. 2017/18 වර්ෂයේදී සීනි කිලෝග්‍රෑම් එකක සාමාන්‍ය විකුණුම් මිල රුපියල් 99.11 කි. එසේම, කිලෝ ග්‍රෑම් එකකට රුපියල් 52-58/= ක ගොඩබෑමේ වියදමින් හා කිලෝ ග්‍රෑම් එකකට රුපියල් 30/= ක් වූ වත්මන් බදු වටිනාකම හා සෙස් බදු රුපියලද ඇතුලත්ව රුපියල් 85/= ක ට අඩුවෙන් රටට සීනි ආනයනය කල හැකි වේ. මෙමගින් මෙරට නිපදවන සීනි සඳහා ඉල්ලුම ලිහිල් වීම ඔස්සේ දේශීය නිෂ්පාදනයට බලපෑම් එල්ල වනු ඇත.

ඉහළ නිෂ්පාදන පිරිවැය සහ අඩු විකුණුම් මිල සැලකිල්ලට ගත් විට, මූල්‍යමය ශක්‍යතාවය උදෙසා, සීනි නිෂ්පාදන ක්‍රියාවලියේ අතුරුඵල ලෙස එතනෝල් නිෂ්පාදනය, විදුලිය උත්පාදනය, කොම්පෝස්ට් සහ $CO_2$ නිෂ්පාදනය සිදු නොකළහොත් සීනි කර්මාන්තයට නොනැසී පැවතිය නො හැකි ය. නිෂ්පාදන පිරිවැය සහ ලෝක වෙළඳපල මිල සහ රජයේ ප්‍රතිපත්ති මගින් බලපෑමට ලක්වන ආදායම සැලකිල්ලට ගත් විට වර්තමාන සීනි කර්මාන්තය පවත්වාගෙන යාම අභියෝගයකි. කෙසේ වෙතත්, ඉහත සඳහන් අනෙකුත් සියලුම සමාන්තර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමත් සමඟ කෙටි කාලයක් තුළ සියලු බාධක ජය ගැනීමෙන් මෙම අභියෝගය ධනාත්මක තත්ත්වයකට හැරවිය හැකි ය යන විශ්වාසය ගල්ඔය වැවිලි සමාගමේ කළමණාකාරිත්වය සතු ය.

**අධ්‍යක්ෂ මණ්ඩලය, විධායක නිලධාරී කණ්ඩායම, කාර්යය මණ්ඩලය හා අපගේ ගොවි ප්‍රජාව පසුගිය වසර පුරා දැරූ උත්සාහයට හා ලද ජයග්‍රහණ සම්බන්ධයෙන් මාගේ ස්තූතිය පුද කර සිටිමි. ශ්‍රී ලංකා රජය, රාජ්‍ය නිලධාරීන්, ප්‍රාදේශීය දේශපාලනඥයින් හා මෙම ව්‍යවසායේ අනෙකුත් පාර්ශ්වකරුවන් ලබා දුන් අඛණ්ඩ සහයෝගය වෙනුවෙන් අපි කෘතඥ වෙමු. තවද, සංස්ථාවේ කටයුතු කෙරෙහි උනන්දුවක් දක්වන අන් සැමගේ සහ මූල්‍ය ආයතනවල සහයෝගය මෙන්ම විශේෂයෙන්ම මෙම ව්‍යවසායකත්ව ආකෘතිය පිළිබඳව අඛණ්ඩව විශ්වාසය තැබීම අගයකොට සලකමු.**



**කීර්ති බී. කොටගම**

සභාපති

19.03.2019

ගාමිණී රත්නායක
අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී
සීමාසහිත ගල්ඔය
වැවිලි (පුද්ගලික) සමාගම



# ප්‍රධාන විධායක නිලධාරීතුමාගේ පණිවිඩය

**2016 මාර්තු 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා සීමාසහිත ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගමේ කාර්ය සාධන වාර්තාව ඔබ වෙත ඉදිරිපත් කරනුයේ ඉමහත් සතුටින්ය.**

පසුගිය මුල්‍ය වර්ෂය වූ 2016/17 ට සාපේක්ෂව සමාලෝචනයට භාජනය වූ වර්ෂය සමාගමට තරමක් ධනාත්මක විය. මේ අනුව වර්ෂය තුළ සැකසූ උක් දඬු සහ නිපදවූ සීනි ප්‍රමාණය පිළිවෙලින් 16% කින් සහ 24% කින් වැඩි විය.මූල්‍ය වර්ෂය තුළ උක් දඬු මෙට්‍රික් ටොන් 169,939.74 ක් සකස් කිරීමට අපට හැකි වූ අතර අළෙවි කළ නොහැකි සීනි ද ඇතුලත්ව මෙට්‍රික් ටොන් 12,541.40 ක් නිපදවිය. උක් සැපයුම වැඩිවීම පසුගිය වසර තුල නිෂ්පාදනය ඉහල යාමට හේතු වුවද ස්කාගාර බලපත්‍ර ලබා දීම ප්‍රමාද වීම හේතුවෙන් නිෂ්පාදනය කර තිබූ එතනෝල් ලීටර් 500,440 පවා අලෙවි කිරීමට 2018 මාර්තු 31 වන දින වන තෙක් එතනෝල් අලෙවිය සක්‍රීය නොවූ බැවින් මුදල් ගලා ඒම රඳා පැවතියේ සීනි අලෙවිය මත පමණි. වර්ෂ 2017 පෙබරවාරි සිට එතනෝල්වලින් මසකට රුපියල් මිලියන 225 ක් සහ දළ වශයෙන් වසරකට රුපියල් බිලියන 2 ක් මෙම ස්කාගාර ව්‍යාපෘතිය මගින් ලැබෙනු ඇතැයි අපි පුරෝකථනය කළෙමු.

2017/18 වර්ෂය සඳහා වැවිලි දෙපාර්තමේන්තුව යටතේ බිම් සකස් කිරීම හා සිටුවීමේ වැඩසටහන හෙක්ටයාර 1,965 කින් යුක්ත වේ. කෙසේ වෙතත්, පැවති නියඟ තත්ත්වය හේතුවෙන් වාරිමාර්ග දෙපාර්තමේන්තුව ජල සැපයුම පාලනය කර ඇති අතර ජලය  නිකුත් කිරීමේ කාලාන්තරවල දින ගණන් ඉහල නැංවීම රෝපණ වැඩසටහනට අහිතකර ලෙස බලපා ඇත.

උක් අස්වැන්නත් සමඟ අතුරු වගාව ව්‍යාප්ත කිරීම මගින් අම්පාර දිස්ත්‍රික්කයේ ඉඩම්ලාභීන්ගේ අදායම ඉහළ නැංවීමේ අරමුණින් 2017 වසරේදී ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන (නඩෙප්) වැඩසටහන සමඟ ගල්ඔය වැවිලි සමාගම හවුල් විය. මෙම ව්‍යාපෘතිය යටතේ ව්‍යාප්ති සේවා සහය ලබා දීම, කාරක ප්‍රාග්ධනය සඳහා ණය ලබා දීම, බෝග රක්ෂණය සහ උපකරණ ප්‍රදානය කිරීම තුළින් උක් ගොවීන් 273 දෙනෙකුට ප්‍රතිලාභ ලැබී තිබේ. මෙම හවුල්කාරිත්වය තුළින් කුඩා පරිමාණ ගොවීහු පළමු වසරේදී 6.5% ක පොලී අනුපාතයකට රු. 150,000 ක් දක්වා මූල්‍ය සහාය සමඟ, සෑම ගොවියෙකුටම රුපියල් 54,000 ක් වටිනා අතුරුයත්ගෑමේ යන්ත්‍රයක් බැගින් ප්‍රදානය කරන ලදී. ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහන තව දුරටත් පුළුල් වෙමින් පවතින අතර  එක් අයෙකුට රුපියල් 230,915 ක් මූල්‍ය ප්‍රතිපාදනයක් හා උපකරණ වෙනුවෙන් රුපියල් 78,000 ක් බැගින් ගොවීන් 4,000 ක ට 2018/19 වර්ෂය තුලදී ලබා දීමට බලාපොරොත්තු වේ.

උක් වගාවට වැළදෙන රෝග, විශේෂයෙන් සුදු කොළ රෝගය යනු පසුගිය වසර කිහිපය තුළ ගල්ඔය වැවිලි සමාගමේ වගාවන්ට මෙන්ම ශ්‍රී ලංකාවේ සීනි කර්මාන්තයට ද දැඩි ලෙස බලපාන ලද වඩාත් විනාශකාරී උක් රෝග වලින් එකක් වන අතර එය 2017/18 වර්ෂයේ දී එම බලපෑම සැලකිය යුතු තරම් උත්සන්න විය. මෙහි ප්‍රතිඵල වූයේ අස්වැන්න හා සීනි ප්‍රමාණය පහත වැටීම හෝ අස්වැන්න නෙළීමට පෙර බෝගය සම්පූර්ණයෙන්ම විනාශ වීමයි. තවද, අම්පාර ප්‍රදේශයේ වගාවන්ට දැඩි නියඟය බලපා ඇති අතර ජල සම්පාදන දුෂ්කරතා රැසකට මුහුණ දී තිබේ. එසේම, වැසි සමයේදී දැඩි ගංවතුරට හසුවීමෙන් ශාක මියයන ආකාරය ද අපි අත් දකින්නෙමු.

උක් පර්යේෂණ ආයතනය රෝගවලට හා නියඟයට ප්‍රතිරෝධී සහ ඉහළ අස්වැන්නක් සහිත උක් ප්‍රභේද හඳුන්වා දීම සඳහා සම්බන්ධ විය යුතු ය. දැඩි නියඟ තත්වයකදී ක්ෂුද්‍ර වාරිමාර්ග පහසුකම් සැපයිය හැකි ය. ඒවා මිල අධික වන අතර අරමුදල් පහසුකම් හෝ සහනාධාර අවශ්‍ය වේ. ඉඩම් අයිතිය රජය සතුව පැවතිය යුතු ය. ගිවිසුමට අනුව දේශපාලනඥයන් සහ රජයේ නිලධාරීන් විසින් සීනි කර්මාන්තයට සහාය සැපයීමට නියමිත ය.

අපි, ඉදිරි වසර දෙස සුභවාදීව බලා සිටින අතර සීනි කර්මාන්තය ආශ්‍රිත වටපිටාව වඩාත් හිතකර වී වගාව කෙරෙහි උනන්දුව වැඩි කිරීම සඳහා සමාගම සැලසුම් කර ඇති අස්වනු ලාභාංශ දියත් කිරීමේ තිරසාර පියවර තැබීමට අපේක්ෂා කරන්නෙමු. උක් වගාව සඳහා පමණක් වෙන් කර ඇති හෙක්ටයාර 5,202 ක භූමි ප්‍රමාණයක්; වසර 50 කට වැඩි පළපුරුද්දක් ඇති ගොවීන්ගේ දැනුම හා විශේෂඥතාව; වාරිමාර්ග පහසුකම් හා යටිතල පහසුකම් සඳහා ප්‍රවේශය, සහ  බීජ උක් හා කාර්ය මණ්ඩලයේ පර්යේෂණ හා දැනුම හා පළපුරුද්ද සම්බන්ධයෙන් උක් පර්යේෂණ ආයතනය සමඟ සෘජු සම්බන්ධීකරණය වැනි සැලකිය යුතු ශක්තීන් සමාගම සතු ය.  මෙම සාධක මගින් සමාගම සිය සීනි නිෂ්පාදනයේ ඉල්ලුම සපුරාලීම සඳහා සැපයුම ප්‍රමාණවත් නොවන වෙළඳපොළක් උපයෝගී කර ගැනීමට හොඳින් සූදානම්ව සිටී. එල්.ඕ.එල්.සී (පී.එල්.සී.) සහ බ්‍රවුන් සහ සමාගම (පී.එල්.සී.) සතු කොටස් ගල්ඔය වැවිලි සමාගම ආරම්භයේ සිටම එහි කළමනාකරණය සඳහා උපරිම සහයෝගය ලබා දී ඇත.

**අධ්‍යක්ෂ මණ්ඩලය, විධායක කණ්ඩායම, සේවකයින් සහ අපගේ ගොවි ප්‍රජාව පසුගිය වසර පුරා දැරූ උත්සාහයන් සහ ලැබූ ජයග්‍රහණ පිළිබඳව මා ස්තූතිවන්ත වෙමි. සමාගමේ අනෙකුත් සියලුම පාර්ශවකරුවන්ගේ සහ මූල්‍ය ආයතනවල සහයෝගය, විශේෂයෙන් මෙම ව්‍යාපාර ආකෘතිය කෙරෙහි තැබූ අඛණ්ඩ විශ්වාසය අගය කරන අතරම ශ්‍රී ලංකා රජය, රජයේ නිලධාරීන් සහ ප්‍රාදේශීය දේශපාලනඥයින් සහ මෙම ව්‍යාපාරයේ අනෙකුත් හවුල්කරුවන්ගේ අඛණ්ඩ සහයෝගයට මාගේ කෘතඥතාවය පුද කරමි.**



**අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී**
19.03.2019

# මූල්‍ය ප්‍රවණතා

## සමාගම ලබාගත් ණය (රුපියල්)




## සමාගමේ සමස්ත වත්කම්



## පිරිවැය හා වියදම් 2017/18




## සමාගමේ කොටස් හිමිකම්




## අයභාරය හා වෙනත් ආදායම් (රුපියල්)



# කොටස් හිමියන්ගේ ආයෝජන

## බ්‍රවුන්ස් සහ සමාගම (පී.එල්.සී.)

බ්‍රවුන්ස් සහ සමාගම කර්මාන්ත ක්ෂේත්‍ර හතක් ඔස්සේ ස්වකීය මෙහෙයුම් විවිධාංගීකරණය කළ සමූහායතනයකි. වසර 135 කට අධික කාලයක් පුරා ව්‍යාපාරික ක්ෂේත්‍රයේ රැඳී සිටිමින් ශ්‍රී ලාංකීය පාරිභෝගික අවශ්‍යතා පිළිබඳ සමාගම ලද ගැඹුරු අවබෝධය සියලුම ශ්‍රී ලාංකිකයන් වෙත උසස් ගුණාත්මයෙන් යුත් භාණ්ඩ හා සේවාවන් සැපයීමේ දී භාවිතා කරනු ලබයි.

බ්‍රවුන්ස් සමූහායතනය, ප්‍රමුඛ පෙළේ ගෝලීය වෙළෙඳ සන්නාම කීපයක් සමඟ කටයුතු කරයි. ඔස්ට්‍රියානු ගුවන් ප්‍රවාහන සමාගම, බීජී, කොන්ටිනෙන්ටල් ගුවන් ප්‍රවාහන සමාගම, ඉක්ලිප්ස්, එක්සයිඩ් බැටරීස්, ඉන්ටර්වට්, ඔසී, ඔලිම්පස්, ශාර්ප්, ඉයුකනුබා, ටැෆේ, සැග්රෝ, යන්මාර් මැරීන් එන්ජින්ස්, අශෝක් ලේලන්ඩ් මැරීන්, පිටනි බොව්ස්, ස්කැන්ඩිනේවියන් ගුවන් ප්‍රවාහන සමාගම, මකීටා, මැක්ටෙක්, එෆ්.ජී. විල්සන්, යමාෂා, ඩේලිම් රෝයල් බොයිලර් සමාගම, එම්.එෆ්.ජී. සිෆැන්ග්, සහ මැසී ෆර්ගියුසන් ඉන් කිහිපයකි. බ්‍රවුන්ස් සහ සමාගම දැනටමත් දීප ව්‍යාප්ත ගෘහස්ථ වෙළෙඳ නාමයකි.

බ්‍රවුන්ස් සහ සමාගම නිසොල්මන්ව නමුත් වේගවත්ව, සරලව හා බාධාවකින් තොරව, විෂය පථයන් විශාල ලෙස පුළුල්කරමින් හා අප සේවාවන් සපයන සැමට භාණ්ඩ, සේවාවන් හා වටිනාකම් අතින් විශිෂ්ටත්වය මුදාහරිමින්, සක්‍රිය, නවීන සහ අනර්ඝ සමාගම බවට අපි අද පත්ව සිටිමු






# ලංකා ඔරික්ස් ලීසිං සමාගම (පී.එල්.සී.)

වසර තිස් හතරකට ප්‍රථම, ආනාගතය පිළිබඳ මනා පෙර දැක්මකින් යුත්, ඉතා නිවැරදිව කාලය විනිවිද යාමේ හැකියාව සහිත සමාගමක් විසින් එවකට ශ්‍රී ලාංකීය වෙළෙඳ ක්ෂේත්‍රය තුළ ප්‍රබල උවමනාවක්ව පැවති කල්බදු විසඳුම් සැපයීමේ ප්‍රමුඛයා ලෙස සිය දොරටු විවෘත කරන ලදී. එය ලංකා ඔරික්ස් ලීසිං සමාගමයි (එල්.ඕ.එල්.සී.). ඉතා කෙටි කලක් තුළ ණය එකතුකිරීම, ඉතුරුම් හා තැන්පතු, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ඉලක්ක කරගත් මූල්‍ය පහසුකම්, ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම්, ඉස්ලාම් මූල්‍ය පහසුකම් හා විදෙස් විනිමය තැන්පතු යනාදී කල්බදු පහසුකම් සැපයීමෙන් ඔබ්බට ගමන් කරමින් විශේෂකරණය වූ මූල්‍ය සේවාවන් රැසක් සපයමින් ලංකා ඔරික්ස් ලීසින් සමාගම විසින්ඔරික්ස් ලීසින් සමාගම් සමූහය ස්ථාපනය කරන ලදී. විවිධාකාර ක්ෂේත්‍රයන්හි නියැළීම තුළින් ලද සමුච්චිත ඵලය මනාව තුළනය කරගනිමින්, ලංකා ඔරික්ස් ලීසින් සමාගම රථවාහන කළමනාකරණය, තොරතුරු තාක්ෂණය හා රථවාහන ආශ්‍රිත සේවාවන් සැපයීම ආරම්භ කරන ලදී. ශ්‍රී ලංකාවේ වර්ධනය හා සංවර්ධනය ආශ්‍රිත ක්ෂේත්‍රයන් තුළ මතුවන නව ව්‍යවසායකත්ව අවස්ථා පෙළගැස්වීම සඳහා ලංකා ඔරික්ස් ලීසින් සමාගම උපායමාර්ගික තීරණයකට එළඹුණි. එමඟින් ස්වකීය ව්‍යාපාරික කටයුතුවල වර්ධනයක් අත්පත්කර ගනිමින්ම කෘෂිකර්මාන්තය, විනෝද කටයුතු, ඉදිකිරීම් හා පුණර්ජනනීය බලශක්ති යනාදී ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කරනු දක්නට හැකිය. අද වන විට, ලංකා ඔරික්ස් ලීසින් සමාගම නිසැක වශයෙන්ම තිරසාර වූ ශ්‍රී ලාංකීය ව්‍යාපාර සමූහ අතරින් එකක් බවට පත්ව තිබේ. කෙසේ නමුත්, නොවෙනස්ව හෝ හායනය නොවී පවතින්නේ අනාගත සාර්ථකත්වය උදෙසා සමාගම සතු වූ ගාමක බලය, ක්‍රියාශූර බව, දැඩි උද්යෝගය හා සියලු දෙනාටම ඉඩ ප්‍රස්ථා විවෘත කරදීමට පවතින පරම හැකියාවයි. අපගේ ව්‍යාපාරය හැමවිටම පෙරමුණ ගන්නේ ව්‍යවසායකයන් ඉහළ කළමනාකාරීත්වය වෙත බද්ධ කිරීමේ සිට ජන ජීවිත හා ජීවනෝපායන් වැඩිදියුණු කිරීම හා ඒවායේ ඉදිරි ගමන සැලසීම, ඔවුන්ගේ සිහින සැබෑ කිරීම හා දීර්ඝ කාලීන අභිලාශයන් මුදුන් පමුණුවාලීම මෙන්ම ජනතාව බලගැන්වීම සඳහා අවශ්‍ය භාණ්ඩ හා සේවාවන් සැපයීම පිණිස ය.

# අධ්‍යක්ෂ



## කීර්ති බී. කොටගම - සභාපති

කෘෂිකර්ම විද්‍යාවේදී (ගෞරව) උපාධිය, ව්‍යාපාර කළමනාකරණ (මූල්‍ය හා තාක්ෂණික කළමනාකරණය) විද්‍යාපති උපාධිය

කීර්ති බණ්ඩාර කොටගම කෘෂිකර්මය හා ව්‍යාපාර කළමනාකරණය යන ක්ෂේත්‍රයන්හි වෘත්තීය විධායක නිලධාරියෙකි. ඔහු ස්වකීය කෘෂිකර්ම විද්‍යාවේදී (ගෞරව) උපාධිය ශ්‍රී ලංකා පේරාදෙණිය විශ්ව විද්‍යාලයෙන් ලබා ගත් අතර තායිලන්තයේ ආසියානු තාක්ෂණික ආයතනයෙන් ව්‍යාපාර කළමනාකරණ (මූල්‍ය හා තාක්ෂණික කළමනාකරණය) විද්‍යාපති උපාධිය ලබාගෙන තිබේ. ඒ මහතා විසින් ඉටුකළ සේවාවන් හා ලබාදුන් දායකත්වය දේශීය හා ජාත්‍යන්තර සංවිධාන කීපයක ගෞරවයට හා පිළිගැනීමට පාත්‍ර වී තිබේ.

## ඩී. එම්. එල්. බණ්ඩාරනායක - අධ්‍යක්ෂ



එම්එස්සී (ව්‍යාපාර කළමනාකරණය) ඕස්ට්‍රේලියාවේ වික්ටෝරියා විශ්ව විද්‍යාලය, එම්.ඒ (සිංහල භාෂාව), කැලණිය විශ්ව විද්‍යාලය, බී.ඒ. (පේරාදෙණිය විශ්ව විද්‍යාලය), රාජ්‍ය කළමනාකරණ ඩිප්ලෝමාව, ස්ලිඩා

බණ්ඩාරනායක මහතා 2018 සිට වර්තමානය තෙක් අම්පාර දිස්ත්‍රික් ලේකම්වරයා වේ. ඔහු ඌව පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම්, වැවිලි අමාත්‍යාංශයේ අතිරේක ලේකම්, පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශයේ අතිරේක ලේකම්, ඇල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රාදේශීය ලේකම්, ඌව පළාතේ එම්.ඩී.ටී.අයි හි අධ්‍යක්ෂ , ඌව පළාත් ඉඩම් කොමසාරිස්, හපුතලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සහකාර ප්‍රාදේශීය ලේකම්, වාරිමාර්ග අමාත්‍යාංශයේ සහකාර ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ සහ ගුරු පදවිය යන තනතුරු හොබවා ඇත.



## සීනිවාසන් ගිරිදරන් - අධ්‍යක්ෂ

සීනිවාසන් ගිරිදරන් මහතා රාජ්‍ය අංශයේ ප්‍රමුඛ වෘත්තිකයෙකි. ඔහු මුදල් අමාත්‍යාංශයේ මහලේකම් කාර්යාලයේ තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරයෙකි. ඔහු ශ්‍රී ලංකා පරිපාලන සේවයේ වසර 24 කට වැඩි පළපුරුද්දක් ලබා ඇත. මඩකලපුවේ ශාන්ත මයිකල් විද්‍යාලයේ නිරමාණයක් වන එස්. ගිරිදරන් මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ කළමනාකරණය පිළබඳ පශ්චාද් උපාධි ආයතනයෙන් රාජ්‍ය කළමනාකරණය පිලිබඳ විද්‍යාපති උපාධියත් නැගෙණහිර විශ්ව විද්‍යාලයෙන් විද්‍යාවේදී උපාධියත් ලබා ගෙන තිබේ. රොටරි සමාජයේ මඩකලපුව උරුමයේ සභාපති වීම වැනි සමාජ ක්‍රියාකාරකම් සමඟ සම්බන්ධ වේ.

## දූෂ්‍යන්ත බස්නායක - අධ්‍යක්ෂ



දූෂ්‍යාන්ත බස්නායක මහතා ව්‍යාපාරික පරිපාලනය පිළිබඳ ලන්ඩන් මෙට්‍රොපොලිටන් විශ්ව විද්‍යාලයේ උපාධිධාරියෙකු වන අතර ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ පීඅයිඑම් හි ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විධායක ශාස්ත්‍රපතිවරයෙකි. එසේම, ඔහු ඇමරිකා එක්සත් ජනපදයේ හොනොලුලු විශ්ව විද්‍යාලයෙන් එම. බී. ඒ. උපාධියක් ලබා ඇත. ඇසෝසියේටඩ් පුවත්පත් සිලෝන් ලිමිටඩ් හි මූල්‍ය අධ්‍යක්ෂවරයා වන ඔහු බොහෝ පෞද්ගලික සමාගම්වල විධායක අධ්‍යක්ෂවරයෙකු ලෙස සේවය කර ඇත. විශේෂයෙන් මුද්‍රිත මාධ්‍ය, විදුලි සංදේශ, ඖෂධ සහ වෙළඳාම යන අංශවල විශාල ව්‍යාපාර කළමනාකරණය කිරීමේ අත්දැකීම් ඔහු සතු ය.

.



## එන්.එස්. වනසිංහ - අධ්‍යක්ෂ

එම්.ඒ (ආර්ථික විද්‍යාව) කැලණිය විශ්ව විද්‍යාලය, බී.කොම් (විශේෂ) - ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය.

වනසිංහ මහතා වර්ෂ 2015 සිට වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (සැලසුම්) වේ. ඔහු පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (සැලසුම්), කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්), මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහකාර අධ්‍යක්ෂ (සැලසුම්), රජරට නවෝදය ව්‍යාපෘතියේ නියෝජ්‍ය අධ්‍යක්ෂ සහ 2002 සිට උතුරු මැද පළාත් ග්‍රාම සංවර්ධන ව්‍යාපෘතියේ (ඒඩීබී) සහකාර අධ්‍යක්ෂ.

# මණ්ඩලය



## කිත්සිරි ගුණවර්ධන - අධ්‍යක්ෂ

නීතිඥ, අලෙවිකරණ කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (පී.අයි.එම්, ශ්‍රී ජයවර්ධනපුර) ප්‍රධාන මෙහෙයුම් නිලධාරී - එල්ඕඑල්සී, ප්‍රධාන නීති නිලධාරී - එල්ඕඑල්සී සමූහය

2004 දී එල්.ඕ.එල්. සී. හා සම්බන්ධ වූ අතර නීතිඥයෙකු ලෙස වසර 30 කට වැඩි පළපුරුද්දක් ඇත. ඔහු නීතිපති දෙපාර්තමේන්තුවට අනුයුක්ත රජයේ නීති කවුසිල කාර්යාලය, ශ්‍රී ලංකාවේ සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ නෛතික හා බලාත්මක කිරීමේ අධ්‍යක්ෂ කාර්යාලය සහ ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය ඇතුළු රජයේ වැදගත් තනතුරු ගණනාවක් දරා ඇත. පාරිභෝගික කටයුතු අධිකාරියේ පළමු අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස එය පිහිටුවීමට සම්බන්ධ විය. ඔහු එල්.ඕ.එල්. සී.සමූහයේ දේශීය හා විදේශීය උප සමාගම් ගණනාවක මණ්ඩලවල සේවය කරයි.



## ගාමිණී රත්නායක - අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී

කෘෂිකර්ම විද්‍යාවේදී (විශේෂ) උපාධිය (පේරාදෙණිය විශ්ව විද්‍යාලය), කෘෂිකර්ම දැනුම්-පද්ධති කළමනාකරණය විද්‍යාපති උපාධිය (වාගනින්ගන් විශ්ව විද්‍යාලය, නෙදර්ලන්තය), ඉඩම් ප්‍රතිසංස්කරණය හා ග්‍රාමීය සංවර්ධනය පිළිබඳ ඩිප්ලෝමාව (තායිවානය හා පිලිපීනය), නියඟයට ග්‍රාහී ප්‍රදේශ පිළිබඳ විශේෂ අවධානය යොමුකළ ජල පෝෂක කළමනාකරණ වැඩසටහන (ඉන්දියාවේ ගුවාහාටි සහ ඇසැම් ප්‍රදේශ)
රත්නායක මහතා සීමාසහිත ගල්ඔය වැවිලි පුද්ගලික සමාගමේ හා සීමාසහිත ගල්ඔය (පුද්ගලික) සමූහ ව්‍යාපාරයේ වත්මන් අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරීවරයායි. ගොවිජන පර්යේෂණ ක්ෂේත්‍රයේ වසර 17 කට වැඩි පළපුරුද්දක් සහිත ඒ මහතා උක් පර්යේෂණ ආයතනයේ ක්‍රියාකාරී අධ්‍යක්ෂ, අතිරේක වැවිලි බෝග සංවර්ධන අමාත්‍යාංශයේ ව්‍යාපෘති අධ්‍යක්ෂ, සහ තල් සංවර්ධන මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී යන තනතුරු ද හොබවා ඇත.



## ධනේෂ් අබේරත්න - විධායක අධ්‍යක්ෂ

විද්‍යාවේදී විශේෂ උපාධිය (ඉංජිනේරු විද්‍යාව), (එක්සත් රාජධානිye වරළත් ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ අධි සාමාජික, එක්සත් රාජධානිye අලෙවිකරණය පිළිබඳ වරලත් ආයතනයේ අධි සාමාජික, එක්සත් ජනපදye වරලත් ගෝලීය කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ අධි සාමාජික, ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ ආයතනයේ අධි සාමාජික

ධනේෂ් අබේරත්න මහතා වර්තමානයේ දී සීමාසහිත ගල්ඔය වැවිලි **(පුද්ගලික) සමාගමේ විධායක අධ්‍යක්ෂ තනතුරත්, සීමාසහිත ගල්ඔය (පුද්ගලික) සමූහ ව්‍යාපාරයේ අධ්‍යක්ෂ තනතුරත් හොබවයි. එතුමා, බ්‍රවුන් සහ සමාගමේ (පී.එල්.සී.) ප්‍රධාන මෙහෙයුම් නිලධාරී තනතුරද දරයි. බහුජාතික සමාගම් ද ඇතුළුව දිවයිනේ ප්‍රමුඛ පෙළේ සමාගම් කිහිපයක කළමනාකරණ තලයේ වසර 10ක පලපුරුද්දක් සතු ඒ මහතා තවත් සමූහ ව්‍යාපාරවල අධ්‍යක්ෂ තනතුරු හොබවයි. බහුජාතික සමාගම්වල සේවයේ යෙදී සිටියදී ඒ මහතා විදෙස් ව්‍යාපෘතිවල නියැළී ඇත.**



## වසන්ත බටගොඩ - අධ්‍යක්ෂ

එල්. එල්. බී.(ගෞරව), (කොළඹ) එල්.එල්.එම්. (කොළඹ). නීතිඥ

වසන්ත බටගොඩ, නීති වෘත්තියේ වසර 16 ක ක්‍රියාකාරී ලෙස අභ්‍යාසයේ නියැලෙන නීතිඥයෙකි. 2003 දී නීති වෘත්තියට ඇතුළත් වූ ඔහු මුල් උසාවිවල සහ අභියාචනාධිකරණවල ද නීතිමය කටයුතුවල නිරත විය. ඔහු කොළඹ විශ්ව විද්‍යාලයේ නීති පීඨයෙන් එල්.එල්.බී දෙවන පන්තියේ ගෞරව සාමාර්ථයත් බුද්ධිමය දේපළ නීතිය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියත් ලබා ගත්තේය. ඔහු 2014 දක්වා ජ්‍යෙෂ්ඨ ජනාධිපති නීතිඥවරයා සමඟ ඉහළ පෙළේ අපරාධ නඩු ගණනාවක පෙනී සිටියේය. ඔහු 2014 දී එල්. ඕ . එල්. සී. සමූහයට සහකාර සාමාන්‍යාධිකාරී ලෙස සම්බන්ධ වූ අතර දැනට නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නීති සහ උපායමාර්ගික ව්‍යාපාර) ලෙස සේවය කරයි. ඔහු බ්‍රවුන් සහ සමාගම් පීඑල්සී සහ මතුරට වැවිලි සමාගමේ නීති ප්‍රධානියා ලෙස කටයුතු කරයි. එසේම ඔහු සිලෝන් ගැෆීන් ලිමිටඩ් හි අධ්‍යක්ෂවරයෙකි.



## ජන්සෙනි කුහනේසන් (ඒ.සී.අයි . එස්.)- සමාගම් ලේකම්

එල්.ඕ.එල්.සී.ආයතනික සේවා (පුද්ගලික) සමාගම සඳහා ලේකම් සේවාවන් සපයමින් එම ආයතනය නියෝජනය කරන ජන්සෙනි කුහනේසන් මහත්මිය වරලත් ලේකම්වරුන්ගේ සහ පරිපාලකයින්ගේ ආයතනයේ (එක්සත් රාජධානියේ) අධි සාමාජිකාවකි.

# ජෞෂධ



**ගාමිණී කේ.බී. රත්නායක**
අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරී



**එස්. කේ. මුණසිංහආරච්චි**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී -කර්මාන්ත ශාලාව



**ඒ. එච්. ඩබ්ලිව්. මධුෂාන්**
ප්‍රධාන කළමනාකරු - මානව සම්පත් හා පරිපාලන



**කේ.ඩී. ඒ. අයි . පෙරේරා**
ජෞෂධ නිෂ්පාදන කළමනාකරු



**ටී අයි විජේසිංහ**
කළමනාකරු (වැඩපොළ)

# කළමනාකාරිත්වය



**එම්. එම්. ඩී. එස්.එන්. පෙරේරා**
ප්‍රධානී (කෘෂිකර්ම)



**බී. මයිල්රාජ්කර්තිකේයන්**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - ස්කාගාරය



**එච්.සී. ගුණරත්න මහතා**
ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරී



**ඩබ්.ඒ.එච්. විජේසේකර මහතා**
ජ්‍යෙෂ්ඨ කළමනාකරු (විදුලි)



**එස්.එම්.එස්.පී. කුමාර මහතා**
ජ්‍යෙෂ්ඨ කළමනාකරු (ඉංජිනේරු)

# ආයතනික ව්‍යූහය



ගල්ඔය වැවිලි (පුද්) සමාගම
මූල්‍ය දෙපාර්තුමේන්තුව
මූල්‍ය වාර්තාකරණය
ගබඩා/ඉන්වෙන්ට්‍රි
අලෙවි
ගෙවීම
වැටුප්
මානව සම්පත් හා පරිපාලන දෙපාර්තුමේන්තුව
පරිපාලන
මානව සම්පත්
පරිපාලන/නීති
මිලදී ගැනුම්
තොරතුරු තාක්ෂණ
පරිසර සංවර්ධන
කර්මාන්තශාලා දෙපාර්තුමේන්තුව
නිෂ්පාදන
ඉංජිනේරු
විද්‍යාගාර
නිෂ්පාදන
ජල පවිත්‍රාගාරය
කර්මාන්තශාලා සේවා
සැකසුම් හල
ඇඹරුම්/ටර්බයින්
බොයිලේරුව
වැඩපළ
විදුලි
ස්කාගාරය
නඩත්තු
පරිසර
නිෂ්පාදන
කෘෂිකර්ම දෙපාර්තුමේන්තුව
ප්‍රවාහන / බර කිරීම
බර කිරීම
ප්‍රවාහන
ඉඩම් සංවර්ධන
බිම් සැකසුම්
සිවිල්
ශෂ්‍ය විද්‍යා
ඉඩම් බැහැර කිරීම
නිත්ත කලාපය
හිඟුරාණ(නැ/බ)
දීඝවාපිය කලාපය
ගල්මඩුව කලාපය
වරිපතන්චේන කලාපය
පිටස්තර
අම්පාර
සියඹලාන්ඩුව



# වගා කටයුතු

## වර්ෂ 2018 මාර්තු 31න් අවසන් වූ වර්ෂයේ ප්‍රතිඵල

2017/18 කන්නය සඳහා වගාවන්ගෙන් උක් මෙට්‍රික් ටොන් 174,819.46 ක් සහ ශෂ්‍ය විද්‍යා අංශයෙන් මෙට්‍රික් ටොන් 8,790.56 ක අස්වැන්නක්

- සාමාන්‍ය අස්වැන්න - හෙක්ටයාරයට මෙට්‍රික් ටොන් 64 ක්
- හෙක්ටයාර් 1,130.34 ක රෝපණ කටයුතු අවසන් කර ඇති අතර දැනට පවතින උක් බිම් ප්‍රමාණය හෙක්ටයාර් 2,579.40 කි.

## වර්ෂ 2019 මාර්තු 31න් අවසන් වන වර්ෂයේ ඉලක්ක

වගාවන්වලින් ලද මුළු අස්වැන්න මෙට්‍රික් ටොන් 233,205 දක්වා සහ ශෂ්‍ය විද්‍යා අංශයේ අස්වැන්න මෙට්‍රික් ටොන් 15,034 දක්වා වර්ධනය වීම

- හෙක්ටයාර් 4,000 ක නව රෝපණ කටයුතු



ගොවි පවුල් 4,400 ක් සඳහා වෙන් කර දී ඇති හෙක්ටයාර් 5,200 ක් පමණ වූ වාරි ඉඩම් ප්‍රමාණය ද ඇතුළත්ව සමස්ත උක් වගාව හෙක්ටයාර් 7,659 කින් සමන්විත වේ. ව්‍යාපෘති ප්‍රදේශය වරිපතන්චේන, ගල්මඩුව, දීඝවාපි, හිඟුරාන සහ නීත්ත නමින් ප්‍රධාන කලාප 05 කට බෙදා ඇත. ජල යෝජනා ක්‍රමයක් සහිත හෙක්ටයාර් 166 කින් යුත් කේන්ද්‍රීය වතුයාය උක් වගා කළ හැකි ඉඩම් හෙක්ටයාර් 5200 ට අවශ්‍ය පහසුකම් සලසයි.

| කලාපය | වගා වපසරිය (හෙක්ටයාර්) | කට්ටිකරුවන් සංඛ්‍යාව |
|---|---|---|
| වරිපතන්චේන | 1,067 | 947 |
| ගල්මඩුව | 1,233 | 926 |
| දීඝවාපි | 1,034 | 870 |
| හිඟුරාන | 764 | 697 |
| නීත්ත | 1,104 | 1,001 |
| එකතුව | 5,202 | 4,441 |

## උක් පැළ තවාන

ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගමේ ශෂ්‍ය විද්‍යා අංශය උක් රෝපණ ද්‍රව්‍ය නිපදවන අතර උක් පර්යේෂණ ආයතනය සමඟ බද්ධ වී උක් වගාව ආශ්‍රිත විවිධ අංශ පිළිබඳව පර්යේෂණ සිදු කරයි. අනාගත රෝපණ ද්‍රව්‍ය ප්‍රභවය වශයෙනුත්, අත්හදා බැලීමේ වැඩසටහන් සඳහාත් උක් පර්යේෂණ ආයතනයේ උක් ක්ලෝන 20 කට වැඩි සංඛ්‍යාවක් ශෂ්‍ය විද්‍යා අංශය මඟින් නඩත්තු කරයි. පැළ තවාන හෙක්ටයාර් 186.87 කින් සමන්විත වන අතර ඉන් හෙක්ටයාර් 135.0 ක් ප්‍රාථමික රෝපණ ද්‍රව්‍ය නඩත්තු කිරීම සඳහා සැලසුම් කල අතර, හෙක්ටයාර් 45.0ක් ද්විතීයික තවාන සඳහාත් වෙන් කර ඇත. පැළ තවානට අමතරව සමස්ත රෝපණ ද්‍රව්‍ය අවශ්‍යතාව සම්පූර්ණ කිරීම සඳහා කොන්ත්‍රාත් ගොවීන් විසින් ද රෝපණ ද්‍රව්‍ය සපයනු ලැබේ.

## ජයග්‍රහණ

මූල්‍ය වර්ෂය අවසන් වන විට ප්‍රධාන වගා කලාප 5 වන වරිපතන්චේන, ගල්මඩුව, දීඝවාපි, හිඟුරාන, නීත්ත මෙන්ම අම්පාර හා සියඹලාණ්ඩුවේ බාහිර වගාකරුවන්ගේ වගා ප්‍රදේශවල හෙක්ටයාර් 5,268.3 ක උක් වගා කරන ලදී.

බීජ උක් දඬු

වාණිජ උක් දඬු

උක් වගාවෙන්

ශෂ්‍ය විද්‍යා අංශයෙන්




| | Agronomy | Plantation |
|---|---|---|
| Seed Cane | 6,289.92 | 7,133.05 |
| Commercial Cane | 2,500.64 | 167,685.96 |

## ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහන (නඩෙප්)

උක් අස්වැන්නත් සමඟ අතුරු වගාව ව්‍යාප්ත කිරීම මගින් අම්පාර දිස්ත්‍රික්කයේ ඉඩම් ලාභීන්ගේ අදායම ඉහළ නැංවීමේ අරමුණින් 2017 වසරේදී ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන (නඩෙප්) වැඩසටහන සමඟ ගල්ඔය වැවිලි සමාගම හවුල් විය. හවුල්කාරිත්වයේ අරමුණු වූයේ උක් අස්වැන්න හෙක්ටයාරයට මෙට්‍රික් ටොන් 75 සිට 90 දක්වා වැඩි කිරීම සහ 128% ක අයි.ආර්.ආර් අගයක් වෙත ළඟා වීමයි. හවුල්කාරිත්වයේ ප්‍රධාන ලක්ෂණ අතරට ව්‍යාප්ති සහාය, කාරක ප්‍රාග්ධනය සඳහා ණය ප්‍රවේශය, බෝග රක්ෂණය සහ ගොවීන් සඳහා උපකරණ ප්‍රදානය ඇතුළත් විය. මෙම වැඩසටහනේ දී ප්‍රතිලාභීන් 273 දෙනෙකු හවුල්කාරිත්වයට ඇතුළත් කර ඇති අතර ඔවුන් වෙත වසරකට 6.5% ක පොලී අනුපාතයකට උපරිම වශයෙන් රු. 150,000 ක් සහ රුපියල් 54,860 ක් වටිනා අතුරුයත් ගෑමේ යන්ත්‍රයක් බැගින් ලබා දී ඇත.

## උක් වගාවේ ප්‍රගතිය

2017/18 කන්නයේ දී වාණිජ උක් මෙට්‍රික් ටොන් 170,186.60 ක අස්වැන්නක් අපේ උක් වගා බිම් හා ශෂ්‍ය විද්‍යා ක්ෂේත්‍රයන්ගෙන් ලබා ගෙන ඇත. වාණිජ උක්වලට අමතරව බීජ උක් ද මෙට්‍රික් ටොන් 13,423.42 ක අස්වැන්නක් මෙම කාලය තුළ ලබා ගෙන ඇත. වැව්ලි දෙපාර්තමේන්තුව යටතේ ඇති ප්‍රදේශය වාණිජ උක් මෙට්‍රික් ටොන් 167,685.96 ක හා බීජ උක් මෙට්‍රික් ටොන් 7,133.5 ක අස්වැන්නක් ලබා ගෙන ඇති අතර සාමාන්‍ය අස්වැන්න හෙක්ටයාරයට මෙට්‍රික් ටොන් 64 ක් වේ.

## 2017/18 සඳහා නව වගාවන් ප්‍රතිස්ථාපනය කිරීම

| නව වගා ප්‍රදේශ | ප්‍රමාණය (හෙක්.) |
|---|---|
| ශෂ්‍ය විද්‍යා අංශය | 72.44 |
| වගාවන් | 823.60 |
| බාහිර වගාකරුවන් - අම්පාර | 161.70 |
| බාහිර වගාකරුවන් - සියඹලාණ්ඩුව | 72.60 |
| එකතුව | 1,130.34 |

## දැනට පතින වගා ප්‍රදේශ

| බෝග වර්ගය | ප්‍රමාණය (හෙක්.) |
|---|---|
| රෝපිත බෝගය | 1,144.49 |
| පළමු නිරී බෝගය | 963.81 |
| දෙවැනි  නිරී බෝගය | 277.40 |
| තෙවැනි නිරී බෝගය | 74.30 |
| සිව්වැනි නිරී බෝගය | 69.90 |
| පස්වැනි නිරී බෝගය | 37.20 |
| හයවැනි නිරී බෝගය | 11.40 |
| හත්වැනි නිරී බෝගය | 0.00 |
| අටවැනි නිරී බෝගය | 0.90 |
| එකතුව | **2,579.40** |



# නිෂ්පාදනය

## 2018 මාර්තු 31න් අවසන් වූ වසරේ ප්‍රතිඵල

- ඇඹරූ මුළු උක්දඬු ප්‍රමාණය - මෙට්‍රික් ටොන් 169,939.74
- සීනි නිෂ්පාදනය - මෙට්‍රික් ටොන් 12,541.40
- මොලැසස් නිෂ්පාදනය - මෙට්‍රික් ටොන් 8,668.79
- සීනි ප්‍රතිසාදනය 7.48 %

## 2019 මාර්තු 31න් අවසන් වන වර්ෂය සඳහා ඉලක්ක

- ඇඹරීමට අපේක්ෂිත උක්දඬු ප්‍රමාණය - මෙට්‍රික් ටොන් 200,000
- සීනි නිෂ්පාදනය - මෙට්‍රික් ටොන් 16,000
- මොලැසස් නිෂ්පාදනය - මෙට්‍රික් ටොන් 10,000 MT
- සීනි ප්‍රතිසාදනය 8% ක් දක්වා ඉහළ නැංවීම








# කාර්ය මණ්ඩලය



## මානව සම්පත් සමාලෝචනය

**සමාගමක් හෝ සංවිධානයක් සඳහා සේවය කරන පුද්ගලයින් සහ සේවකයින්ට අදාළ සම්පත් කළමනාකරණය කිරීමේ වගකීම දරන දෙපාර්තමේන්තුව යන දෙකම විස්තර කිරීමට මානව සම්පත් භාවිතා කරයි. මානව සම්පත් කළමනාකරණය යනු සංවිධානයක හෝ ව්‍යාපාරයක ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා වැඩසටහන් නිර්මාණය කිරීම සහ ඒවා පරිපාලනය කිරීමයි. සේවායෝජක-සේවක සම්බන්ධතා ගොඩනැගීම, කළමනාකරණය කිරීම සහ වර්ධනය කිරීම යන සමස්ත පරාසය එයට ඇතුළත් ය.**

## මානව සම්පත් හා පරිපාලන දෙපාර්තමේන්තුවේ කාර්යයන්

ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගමේ කොඳු නාරටිය වනුයේ මානව සම්පත් දෙපාර්තමේන්තුවයි. එය ආයතනයේ කෘත්‍යාත්මක කේන්ද්‍රස්ථානය වේ. එය ආයතනයේ සියලුම කටයුතුවලදී ඉතා ලැදියාවෙන් යුතුව පෙරමුණ ගනී. පිටුපසින් සිට දිරිගන්වයි.

මානව සම්පත් දෙපාර්තමේන්තුව හැකි සෑම විටදීම අදාල පාදක දත්ත සමඟ සංසන්දනය කරමින් කාර්යය සාධන මිණුම් හා ශ්‍රම බලකායේ ජනගහණ ලක්ෂණ හා විවිධ වූ මානව සම්පත් ක්ෂේත්‍රවල නැඹුරුතා පිළිබඳ තොරතුරු සම්පිණ්ඩනය කරයි.

මානව සම්පත් දෙපාර්තමේන්තුව වශයෙන් ව්‍යාපාරික අවශ්‍යතා සැපිරෙන පරිදි සමාගමේ වටිනාම සම්පත කළමනාකරණය කරමින් ද පහත සඳහන් කාර්යයන් විවිධ ආකාරයෙන් හසුරුවමින් ද අපගේ සේවය සපයන්නෙමු.

- මානව සම්පත් සැලසුම්කරණය
- බඳවා ගැනීම් සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම
- සේවක සබඳතා
- වේතන කළමනාකරණය
- උසස්වීම් හා ත්‍යාග
- සේවක පුහුණුව හා ප්‍රවර්ධනය
- සේවක සුභසාධනය
- ස්වස්ථතාව හා නිරාපදාව
- අනුකූලතාව
- පොදු පරිපාලනය
- නීති පැණවීම
- ප්‍රසම්පාදනය
- තොරතුරු තාක්ෂනය
- කාර්ය සාධන ඇගයීම

## අපගේ සේවා නියුක්තිය

පහත දැක්වෙන කාණ්ඩ අනුව 2017/18 මූල්‍ය වර්ෂය අවසානයේදී අපගේ සමාගමේ සේවකයින් 924 ක් සිටිය හ. මීට අමතරව, උක්දඬු අඹරන කාලය සඳහා කොන්ත්‍රාත් සේවකයින් 88 ක් සේවය කරන ලදී.

| | ස්ථිර | කොන්ත්‍රාත් |
|---|---|---|
| විධායක කාර්ය මණ්ඩලය | 50 | 16 |
| විධායක නොවන කාර්ය මණ්ඩලය | 293 | 565 |

සාමාන්‍යාධිකාරීගේ සිට කණිෂ්ඨ විධායක කළමනාකාරීත්වය දක්වා වූ සේවක කාණ්ඩ විධායක ශ්‍රේණියට ඇතුළත් වේ. SP 01 සිට S 05 දක්වා වූ මාණ්ඩලික නිලධාරීන් කොන්ත්‍රාත් හා විධායක නොවන ශ්‍රේණිවලට ඇතුළත් වේ. කම්කරු ශ්‍රේණියට P1 සිට P5 දක්වා කාණ්ඩ ඇතුළත්වන අතර ඔවුහු විධායක නොවන, කොන්ත්‍රාත් හා අනියම් පදනම නියෝජනය කරන අය වෙති.

## සේවක සුභසාධනය

සමාගමේ සහයෝගය ඇතිව ආරම්භයේ සිට අඛණ්ඩව පවත්වාගෙන ආ පරිදි ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගමේ සුභ සාධක සංගමය පහත දක්වා ඇති අයුරින් සේවකයන් වෙත වඩාත් වටිනා ප්‍රතිලාභ රැසක් ලබා දේ.

- මරණාධාර
- ණය පහසුකම්
- දරුවන් සඳහා ශිෂ්‍යත්ව
- විවාහ දීමනා
- සුභසාධන අලෙවිසැළ මඟින් සිල්ලර බඩු
- ආපනශාලා පහසුකම්
- ක්‍රීඩා
  උදා: අන්තර් දෙපාර්තමේන්තු ක්‍රිකට් තරඟාවලිය
- විනෝද අවස්ථා
  උදා: වාර්ෂික සුහද හමුව
  අළුත් අවුරුදු උත්සවය
  වාර්ෂික විනෝද චාරිකාව

- සුභසාධන වෙළඳසැලෙන් සාධාරණ මිලකට භාණ්ඩ නිකුත් කිරීම

## සේවක පුහුණුව සහ ප්‍රවර්ධනය

සේවක පුහුණුව හා ප්‍රවර්ධනය යනු සේවක මඬුල්ලේ බහුවිධ ඉගැනුම් ආවරණය කරන පුළුල් මගකි. පුහුණුවක් යනු සේවකයන් නිරතව සිටින භූමිකාවන්හි කාර්යය සාධනය ඉහළ නැංවීම සඳහා ඉවහල්වන සුවිශේෂී වූ දැනුම හෝ නිපුණතා ඉගෙනීමට උපකාරීවන වැඩ සටහනකි. ප්‍රවර්ධනය ඊටත් වඩා පුළුල් වන අතර ඒ හරහා ආසන්නතම භූමිකාවෙන් ඔබ්බට ගමන් කරමින් සේවක වර්ධනය හා අනාගත කාර්යය සාධනය වෙත යොමු වේ.

අපි පොදුජන සමාගමක් වන බැවින් පසුගිය වසර තුළ අපගේ සේවක මඬුල්ලේ කාර්යය සාධනය ඉහළ මට්ටමක පවත්වා ගැනීම පිණිස බොහෝ පුහුණු හා ප්‍රවර්ධන වැඩසටහන් දියත් කරන ලදී. ඒ අතරින් වැඩසටහන් කිහිපයක් පහතින් දැක්වේ.

## සේවක පුහුණුව සහ ප්‍රවර්ධනය

❖ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය සහ දමන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අනුග්‍රහය සහිතව ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය මගින් පවත්වන ලද 'ඵලාදයිතාවය' නමැති එක්දින පුහුණු වැඩසටහනක් සඳහා සමාගමේ නිලධාරීන් 05 දෙනෙකු සහභාගී කරවන ලදී.
❖ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර කාර්ය මණ්ඩල නිලධාරීන්ව සියලුම අංශ සඳහා පෙළඹවීමේ අරමුණින් ඔවුන් 65 දෙනෙකු සඳහා බාහිර-පුහුණු වැඩසටහන දඹුල්ලේදී පවත්වන ලදී.
❖ මානව සම්පත් තොරතුරු පද්ධතිය භාවිතා කරන නිලධාරීන් සඳහා ගෘහස්ථ පුහුණු වැඩසටහනක් සංවිධානය කරන ලදී (එච්.ආර්. අයි.එස්.).

## සුභසාධන හා ආයතනික සමාජ වගකීම් ක්‍රියාකාරකම්

❖ ඒඑස්බී ෆැෂන් සහ ජයෝදා ෆැෂන් යන ආයතන වෙතින් වාරික පදනම මත එක් සේවකයෙකුට රු. 20,000 ක් වටිනා භාණ්ඩ හා රෙදිපිළි මිලදී ගැනීම සඳහා පහසුකම් සලසන ලදී. සිංහල හා හින්දු අලුත් අවුරුද්ද සැමරීම වෙනුවෙන් මෙම වැඩසටහන ක්‍රියාත්මක විය.
❖ දමන කලාපයේ පිහිටා ඇති බෞද්ධ පාසල් 38 ක් අතර බක්ති ගීත තරගයක් සංවිධානය කරන ලදී.





- මඩවලලන්ද පාසලේ නැටුම් කණ්ඩායම සමස්ත ලංකා නැටුම්තරඟාවලිය සඳහා තේරී ඇති බැවින් එම කණ්ඩායමට මූල්‍යමය දායකත්වයක් ලබා දී ඇත.




- අම්පාර දිස්ත්‍රික් ලේකම්තුමාගේ ඉල්ලීම මත මාතර තිහගොඩ ප්‍රදේශයේ ගංවතුරෙන් පීඩාවට පත් ප්‍රදේශවල වෙසෙන ජනතාවට වියළි ආහාර පැකට් 200 ක් ලබා දී ඇත.

# ස්කාගාරය

## 21.5 කේ.එල්.පී.ඩී. නව ස්කාගාරය

සුරාබදු කොමසාරිස්වරයා සහ රේඛීය අමාත්‍යාංශයේ අනුමැතිය සහිතව පැරණි ස්කාගාරයේ ප්‍රතිස්ථාපන කටයුතු 2014 දී ආරම්භ කරන ලදී. අමතර වශයෙන් රුපියල් මිලියන 800 ක් වැය කරමින් අපි එම ප්‍රතිස්ථාපන කටයුතු අවසන් කළෙමු.

මොලැසස් යනු සීනි කර්මාන්තයේ අතුරු ඵලයක් වන අතර එය එතනෝල්, අපිරිසිදු ස්ප්‍රිට්, ෆියුසල් ඔයිල්, ස්පෙන්ට් වොෂ්, ජීව වායුව, $CO_2$ වායුව සහ ජෛව පොහොර වැනි වටිනා නිෂ්පාදන කිහිපයකට පරිවර්තනය කළ හැකි ය.

දිනකට ඇල්කොහොල් ලීටර් 21,500 ක් සහ ජීව වායුව ඝන මීටර් 10,000 ක් බැගින් නිෂ්පාදනය කිරීමට ත්, වාර්ෂිකව ජෛව පොහොර මෙට්‍රික් ටොන් 5000 ක සහ අපත ජල පිරිපහදු යන්ත්‍රයේ කිලෝ ලීටර් 400 ක ධාරිතාවක් සහිතව ස්කාගාර සංකීර්ණය සැලසුම් කර ඇත

## ක්‍රියාවලි විස්තරය

පැසවීම සහ ආසවනය වශයෙන්, උසස් තත්ත්වයේ ඊඑන්ඒ නිෂ්පාදනය සඳහා ප්‍රධාන ක්‍රියාදාමයන් දෙකක් ඇත. ගෘහස්ථ යීස්ට් මුහුන් භාවිතයේ උපරිම කාර්යක්ෂමතාව ලබා ගත හැකි පරිදි සහ කැස්කේඩ් සහ ෆෙඩ් -බැච් මාදිලියේ පැසවුම් යන්ත්‍ර 4ක් මගින් පැසවීම සැලසුම් කර ඇත. සාම්ප්‍රදායික ක්‍රමවලට වඩා කැපී පෙනෙන ලක්ෂණ ඇති වඩාත් නවීන පරිසර හිතකාමී එම්පීආර් ආසවනය (බහු-පීඩන ආසවනය) අනුගමනය කරනු ලැබේ. උසස් තත්ත්වයේ ඊඑන්ඒ ලබා ගැනීම සඳහා අවම බලශක්ති අවශ්‍යතාවයක් සහිත කුළුණු හතේ ආසවනය අනුගමනය කරනු ලැබේ.



# අනාගත සැලසුම්

### කාබනික පොහොර නිෂ්පාදනය - මෙට්‍රික් ටොන් 7000

සීනි කම්හලෙන් සහ ස්කාගාරයෙන් ලැබෙන සියලුම අපද්‍රව්‍ය කාබනික පොහොර බවට පරිවර්තනය කරනු ලැබේ. මෙම ව්‍යාපෘතිය දැනටමත් අවසන් කර ඇත.



### සම-ජනන බලශක්ති බලාගාරය - මෙගාවොට් 10

ගල්ඔය දැනට පවතින මෙගාවොට් 2 ක විදුලි උත්පාදන බලාගාරය මෙගාවොට් 10 ක් දක්වා ඉහළ නංවන අතර අතිරික්ත විදුලිය ජාතික විදුලිබල පද්ධතියට විකුණනු ඇත.



### $CO_2$ නිස්සාරණ ව්‍යාපෘතිය - දිනකට ටොන් 10

ස්කාගාරයේ අතුරුඵල එක්රැස් කර පිරිසිදු කරනු ලැබේ. ව්‍යාපෘතියේ මූලික කටයුතු දැනටමත් ආරම්භ කර ඇති අතර මෙහෙයුම් කටයුතු බාහිර පාර්ශවයක් විසින් සිදු කරනු ඇත.



# අධ්‍යක්ෂක මණ්ඩල වාර්තාව

වර්ෂ 2018 මාර්තු 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා සීමාසහිත ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගමේ අධ්‍යක්ෂ මඬුල්ලේ වාර්තාව සහ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශය ස්වකීය සාමාජිකයන් වෙත මෙසේ ඉදිරිපත් කරන්නේ සතුටිනි.

## මූලික ක්‍රියාකාරකම්

සීමාසහිත ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගමේ මූලික ක්‍රියාකාරකම් වන්නේ, උක් වගා කිරීම, උක් සීනි නිෂ්පාදනය කිරීම, සහ දේශීය වෙළඳපළ සඳහා එතනෝල් (Extra Neutral Alcohol) නිෂ්පාදනය කිරීම යි.

එම කාර්යයන් පිළිබඳ විග්‍රහයක් මෙම වාර්තාවේ පිටු අංක 7සහ 8 හි ඇතුළත්, ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගමේ ප්‍රධාන විධායක නිලධාරීතුමාගේ පණිවුඩයේ සඳහන් වේ.

## ව්‍යාපාරය හා අනාගත ප්‍රවර්ධන කටයුතු පිළිබඳ සමාලෝචනය

මේ වන විට අප සමාගම උක් හෙක්ටයාර 5,985.97 ක් වගා කර ඇති අතර සියඹලාණ්ඩුව සහ මහඔය ප්‍රදේශ ආශ්‍රිතව තව දුරටත් උක් වගාව ව්‍යාප්ත කිරීමට අපේක්ෂිත ය.

## ලාභ සහ අලාභ

2017/18 වර්ෂය සඳහා බදුවලට පෙර පාඩුව රුපියල් 1,342,938,332/= කි.

## බදුකරණය

ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගමේ බදු ප්‍රතිපාදන ලෙස රුපියල් 4,589,788/= ක් මෙම වර්ෂය සඳහා වෙන් කර ඇත. පසුගිය වර්ෂය සඳහා වෙන් කළ මුදල රුපියල් 4,588,763/- කි.

## දේපළ, පිරියත හා යන්ත්‍රෝපකරණ

මෙම මූල්‍ය ප්‍රකාශයේ සටහන 12 මඟින් දේපළ පිරියත හා යන්ත්‍රෝපකරණවලට අදාළ තොරතුරු ඇතුළත් කර ඇත.

## ප්‍රකාශිත ප්‍රාග්ධනය

2018 මාර්තු 31 දිනට සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය රුපියල් 1,011,764,730 ක් වන අතර ඊට සාමාන්‍ය කොටස් 101,176,473 ක් ද ඇතුළත්ය . (2016/17 කොටස් 101,176,473 කි)

## සංචිත

2018 මාර්තු 31 දිනට සමස්ත සංචිත ප්‍රමාණයේ වටිනාකම රුපියල් 5,429,166,673/= කි. පසුගිය වසර හා සැසඳූ විට එය රුපියල් 4.076,727,421/- කි (සමුච්චිත පාඩුව).

## කොටස් හිමියන්

කොටස් හිමියන්ට අපක්ෂපාතී ලෙස සැලකීමත් ඔවුන්ගේ ධනය උපරිමය කිරීමත් සමාගමේ ප්‍රතිපත්තිය කි.

## සේවා නියුක්ති ප්‍රතිපත්ති

සමාගමේ සේවා නියුක්ති ප්‍රතිපත්ති මඟින් සියලු පුද්ගලයන් හට එකසේ සළකනු ලබන අතර ස්ත්‍රී/පුරුෂභාවය, ජාතිකත්වය හෝ ආගම් භේද නොතකා සැමට සම අවස්ථා පිරිනමනු ලබන අතර ප්‍රශස්ථ සේවක සබඳතා වර්ධනය වනු ඇති බව සැලකේ.

## ව්‍යවස්ථාපිත ගෙවීම්

ස්වකීය දැනුවත්භාවය ප්‍රකාරව හා විශ්වාසය පරිදි මේ වන තෙක් සියලු සේවකයන්ට හා රජයට ගෙවිය යුතු සියලු ව්‍යවස්ථාපිත ගෙවීම් සිදු කර ඇති බවට අධ්‍යක්ෂවරුන් සෑහීමට පත් වේ.

## පරිසර ආරක්ෂණය

පරිසරයට සිදුවන අහිතකර බලපෑම් අවම මට්ටමක පවත්වා ගනිමින් අදාළ ආයතන සමඟ සහයෝගීත්වයෙන් හා අනුකූලත්වය ආරක්ෂාවන පරිදි කටයුතු කිරීම සමාගමේ ප්‍රතිපත්තිය වේ.

## අධ්‍යක්ෂ මඬුල්ල

සමාලෝචිත දිනට සමාගමේ අධ්‍යක්ෂ මඬුල්ල පහත පරිදිය.

- ආචාර්ය කේ.බී. කොටගම - සභාපති
-කේ.ඒ.කේ.පී. ගුණවර්ධන - අධ්‍යක්ෂ
- ආර්.එම්.ජී.බී. රත්නායක -අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරී
- ඩබ්.කේ.ඩී.ටී. අබේරත්න - අධ්‍යක්ෂ
- ටී. වනිගසිංහ - අධ්‍යක්ෂ
(13.02.2019 දින ඉල්ලා අස් විය)
- එම්.එම්. ෆවුස් -අධ්‍යක්ෂ
(15.02.2019 දින ඉල්ලා අස් විය)
- බී. එම්. ඩී. බී. බස්නායක -අධ්‍යක්ෂ
- ඩබ්. බටගොඩ -අධ්‍යක්ෂ
- එස්. ගිරිදරන් -අධ්‍යක්ෂ
- එන්.එස්.වනසිංහ -අධ්‍යක්ෂ
(26.02.2019 දින සිට බලපැවැත්වෙන පරිදි පත් විය)
ඩී.එම්. එල්. බණ්ඩාරනායක -අධ්‍යක්ෂ
(26.02.2019 දින සිට බලපැවැත්වෙන පරිදි පත් විය)

## අධ්‍යක්ෂවරුන් පත් කිරීම සහ ඉල්ලා අස් වීම්

එන්.එස්.වනසිංහ මහතා සහ ඩී.එම්. එල්. බණ්ඩාරනායක මහතා 26.02.2019 දින සිට බලපැවැත්වෙන පරිදි අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලදී.

ටී. වනිගසිංහ මහතා13.02.2019 දින සිටත් එම්.එම්. ෆවුස් මහතා 15.02.2019 දින සිටත් බලපැවැත්වෙන පරිදි අධ්‍යක්ෂ මඬුල්ලෙන් ඉල්ලා අස් විය.

## අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

අධ්‍යක්ෂවරුන් විසින් ක්‍රමවත්ව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පවත්වනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල දී යෝජනා සම්මත කිරීමත්, අධ්‍යක්ෂ මඬුල්ල අතර යෝජනා සංසරණය කිරීමෙන් හා සියලුම අධ්‍යක්ෂවරුන් විසින් අනුමත කර අත්සන් තැබූ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා ඉදිරිපත් කිරීම හරහා අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ගනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට ප්‍රථම, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ වාර්තාව, මීළඟ රැස්වීමේ න්‍යාය පත්‍රය සහ මාසික කළමනාකරණ වාර්තා කල් තබා සියලුම අධ්‍යක්ෂවරුන් අතර සංසරණය කරනු ලැබේ.

## මාණ්ඩලීය කමිටුව

මෙහෙයුම් හා පාලන කටයුතුවල විවිධ පැතිකඩයන් පිළිබඳව ප්‍රගති සමාලෝචනය සහ මඟ පෙන්වීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කමිටු පිහිටුවා ඇත.

## විගණන කමිටුව

එස්. ගිරිදරන් මහතා - සභාපති
ජී. රත්නායක මහතා - සාමාජික
(27/03/2018 දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස් විය).
බී. එම්. ඩී. බස්නායක මහතා - සාමාජික
ඩබ්. බටගොඩ මහතා - සාමාජික
(27/03/2018 දින සිට බලපැවැත්වෙන පරිදි පත් විය).
එන්.එස්.වනසිංහ මහතා - සාමාජික
(01/03/2019 දින සිට බලපැවැත්වෙන පරිදි පත් විය).
ඩබ්.කේ.ඩී.ටී. අබේරත්න මහතා - සාමාජික
(01/03/2019 දින සිට බලපැවැත්වෙන පරිදි පත් විය).

සමාගමේ විගණන කමිටුව විසින් බාහිර විගණකවරුන් ආයතනයට ලබා දුන් විගණන නොවන සේවාවන්වල ප්‍රමාණය හා ස්වරූපය පිළිබඳ සමාලෝචනයක් සිදු කරන ලදී. ඒ විගණකවරුන් වශයෙන් ඔවුන්ගේ ස්වාධීනත්වයට හානි වී නොමැති බව තහවුරු කරනු පිණිසය.

පිටු අංක 33 මඟින් විගණන කමිටු වාර්තාව ඉදිරිපත් කර ඇත.

## අධ්‍යක්ෂවරුන්ගේ කොටස් හිමිකම්

2018 මාර්තු 31 දින වන විට කිසිදු අධ්‍යක්ෂවරයකු සමාගමේ කොටස් තබා නොතිබුණි.

## අධ්‍යක්ෂවරුන්ගේ වැටුප

අධ්‍යක්ෂවරුන්ට කිසිදු වේතනයක් / ණය මුදලක් ගෙවා නැත. 61 වන පිටුවේ ඇති මූල්‍ය ප්‍රකාශයේ සටහන අංක 29 බලන්න.

## ගිණුම්කරණ ප්‍රතිපත්ති

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පිටු අංක 41-52 න් දැක්වේ.

## වාර්ෂික මහා සභා රැස්වීම

වාර්ෂික මහා සභා රැස්වීම 2019 අප්‍රේල් 29 දින පස්වරු 3.00 ට කොළඹ 10, ටි.බී. ජයා මාවතේ, අංක 338 දරන තැන පිහිටි එක්සෙල් වර්ල්ඩ් “මාර්කෝපෝලෝ” හිදී පැවැත්වේ. වාර්ෂික මහා සභා රැස්වීම පිළිබඳ නිවේදනය පිටු අංක 65 හි දක්වා ඇත.

## විගණකවරුන්

ඒ අනුව සහ 2007 අංක 07 දරණ සමාගම් පනතේ 154 (1) කොටස ප්‍රකාරව, ඊළඟ වර්ෂය වෙනුවෙන් සමාගමේ විගණකවරුන් වශයෙන් විගණකාධිපති දෙපාර්තමේන්තුව පත් කිරීමට වාර්ෂික මහා සභා රැස්වීමේ දී යෝජනා කරනු ඇත.

2007 අංක 7 දරණ සමාගම් පනතේ 155 (a) කොටස අනුව ඊළඟ වසර සඳහා පත්වන විගණකවරුන් හට ගෙවන වේතන නියම කිරීම සඳහා අධ්‍යක්ෂවරුන් හට බලය පවරන යෝජනාවක් ද වාර්ෂික මහා සභා රැස්වීමේ දී යෝජනා කරනු ඇත.

විගණකවරුන් හට ගෙවනු ලබන ගාස්තු මූල්‍ය ප්‍රකාශයේ සටහන අංක 9 මගින් අනාවරණය කරනු ලැබේ. අධ්‍යක්ෂවරුන්ගේ අවබෝධය පරිදි, ඉහතින් දැක්වූ දැ හැරුණු විට විගණකවරුන් සමඟ සමාගම කිසිදු සබඳතාවක් (විගණකවරයෙක් ලෙස හැරුණු විට) නොදක්වයි. විගණකවරුන් ද සමාගම කෙරෙහි කිසිදු බැඳියාවක් නැත.

අධ්‍යක්ෂ මණ්ඩල නියමය පරිදි

අධ්‍යක්ෂ

එල්.ඕ.එල්.සී.ආයතනික සේවා (පුද්ගලික) සමාගම
ලේකම්වරු

**කොළඹ**
28.02.2019

# අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් පිළිබඳ ප්‍රකාශය

2007 අංක 07 දරන සමාගම් පනතට සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ සම්මතයන්ට අනුව සකස්කර ඉදිරිපත් කරන ලද 2018 මාර්තු 31 න් අවසන් වන වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ වලට අදාළව අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් පහත ප්‍රකාශනයේ දක්වා ඇත.

මූල්‍ය ප්‍රකාශ වලට අදාළව විගණකවරුන්ගේ වගකීම් මෙම වාර්තාවේ 35 වන පිටුවේ ඇතුළත්කර ඇති විගණන වාර්තාවේ සඳහන් වේ. 2007 අංක 07 දරන සමාගම් පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව අධ්‍යක්ෂවරුන් විසින් සෑම මූල්‍ය වර්ෂයක් වෙනුවෙන්ම මූල්‍ය ප්‍රකාශ සකස්කර වාර්ෂික මහා සභා රැස්වීම වෙත ඉදිරිපත් කළ යුතු අතර ඊට ඇතුලත් වන්නේ;

1 මූල්‍ය වර්ෂය සඳහා සමාගමේ හා අනු සමාගම්වල ලාභ අලාභ පිළිබඳ සත්‍ය හා සාධාරණ මත පිළිඹිබු වන විස්තීර්ණ ආදායම් ප්‍රකාශයක්;

2 මූල්‍ය වර්ෂය සඳහා සමාගම හා අනු සමාගම් රඳවාගත් ඉපැයුම් පිළිබඳ සත්‍ය හා සාධාරණ මත පිළිඹිබු වන සම කොටස්වල වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශයක්;

3 මුදල් වර්ෂය සඳහා ව්‍යාපාරය තුළට හා ඉන් පිටතට දිශාමුඛ වූ මූල්‍ය ප්‍රවාහය පිළිබඳ සත්‍ය හා සාධාරණ මත පිළිඹිබු වන මුදල් ප්‍රවාහ ප්‍රකාශයක් සහ;

4 මූල්‍ය වර්ෂයේ අවසානය වන විට සමාගම හා අනු සමාගම් පවත්නා තත්ත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ මත පිළිබිඹු වන මූල්‍ය තත්ත්ව ප්‍රකාශයක්.

තවද, ඒවා පණතට අනුකූල වේ.

ඉහත සඳහන් මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම පිළිබඳව අධ්‍යක්ෂවරුන් දරන මත පහත පරිදිය:

1 උචිත මූලධර්ම අවිරෝධී ලෙස තෝරාගෙන භාවිත කර තිබේ. මූර්ත අපගමනයන් පවතී නම් ඒවා අනාවරණය කර හා පැහැදිලි කර තිබේ.

2 සියලුම යෝග්‍ය ගිණුම්කරණ සම්මතයන් අදාළ පරිදි අනුගමනය කර තිබේ.

3 තීන්දු සහ ඇස්තමේන්තු සාධාරණ හා විචක්ෂණශීලී ය.

ස්වකීය මෙහෙයුම් දියත් කිරීම සඳහා ප්‍රමාණවත් තරම් සම්පත් පවතින බව අධ්‍යක්ෂවරුන්ගේ මතය වන අතර මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේ දී අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම භාවිත කර තිබේ.

තවද, සමාගමේ මූල්‍ය තත්ත්වය වැඩි නිරවද්‍යතාවයකින් යුතුව අනාවරණය කිරීම

සඳහාත්, සමාගම් පනත ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම සහතික කිරීම සඳහාත්, ප්‍රමාණවත් පරිදි ගිණුම් වාර්තා නඩත්තු කරන බව සහතික කිරීමේ වගකීම අධ්‍යක්ෂවරුන් සතු වේ.

සමාගමේ වත්කම් සුරක්ෂිත කිරීම සඳහා නිසි පියවර ගැනීම අධ්‍යක්ෂවරුන්ගේ වගකීම වේ. ඒ වෙනුවෙන් වංචා හා අනෙකුත් අක්‍රමිකතා හඳුනා ගැනීමේ හා වැළැක්වීමේ අරමුණ ඇතිව යෝග්‍ය අභ්‍යන්තර පාලන පද්ධති ස්ථාපනය කිරීම සඳහා නිසි අවධානය යොමු කළ යුතු වේ.

අධ්‍යක්ෂවරුන් විසින් මූල්‍ය ප්‍රකාශ සකස් කළ යුතු අතරම විගණකවරුන්ට අවශ්‍ය ඕනෑම පියවරක් ගැනීම සඳහාත්, විගණන මතය ඉදිරිපත් කිරීමට පහසුවන පරිදි ඕනෑම පරීක්ෂණයක් දියත් කිරීම සඳහාත් අවශ්‍ය සියලු ඉඩ ප්‍රස්ථා සැලසිය යුතු වේ.

## අනුකූලතා වාර්තාව

සමාගම සහ එහි පරිපාලිත සමාගම් විසින් ගෙවිය යුතු සියළුම බදු, තීරුබදු සහ අයබදු, සමාගමේ සේවකයින් සහ එහි අනුබද්ධ සමාගම් වෙනුවෙන් ගෙවිය යුතු සහ සමාගමේ සේවකයන් වෙනුවෙන් හා සම්බන්ධයෙන් ගෙවිය යුතු සියලුම දායක මුදල්, සහ සමාගම සහ එහි පරිපාලිත සමාගම් විසින් ගෙවිය යුතු බව දන්නා සියලුම ව්‍යවස්ථාපිත හිඟ මුදල් ශේෂ පත්‍රයේ දිනය වන විට ඔවුන් උපරිම වශයෙන් දන්නා පරිදි ගෙවා අවසන් කර හෝ ලබා දී ඇති බව අධ්‍යක්ෂවරුන් විසින් සනාථ කරනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

ආචාර්ය කේ.බී. කොටගම
සභාපති
28.02.2019

# විගණන කමිටු වාර්තාව

## කමිටුවේ කාර්යයභාරය

අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ස්වකීය සොයාගැනීම් වාර්තා කරන විගණන කමිටුවේ කාර්යභාරය වන්නේ, සමාගමේ මූල්‍ය වාර්තාකරණයේ අවංකභාවය, සමාගමේ බාහිර හා අභ්‍යන්තර විගණන ක්‍රියාවලිය සහ සමාගම සඳහා ප්‍රබල අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් පවත්වාගෙන යාම මෙන්ම, සමාගම පිළිබඳව අවදානම කළමනාකරණය කිරීම හා නීතිය හා නියාමන අවශ්‍යතාවලට සමාගම අනුකූල වන්නේ ද යන්න පිළිබඳව විමර්ශනය කිරීමයි.

## සංයුතිය

අධ්‍යක්ෂ මණ්ඩලය මගින් පත්කළ එයට වගවන විගණන කමිටුව පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත වේ;

එස්. ගිරිදරන් මහතා - කමිටුවේ සභාපති
බී. එම්. ඩී. බී. බස්නායක මහතා - සාමාජික
ඩබ්. බටගොඩ - සාමාජික
(2018.03.27 දින සිට බලපැවැත්වෙන පරිදි පත් විය).
ඩබ්.කේ.ඩී.ටී. අබේරත්න මහතා - සාමාජික
(2018.03.01 දින සිට බලපැවැත්වෙන පරිදි පත් විය).
එන්.එස්.වනසිංහ මහතා - සාමාජික
(2018.03.01 දින සිට බලපැවැත්වෙන පරිදි පත් විය).
සමාලෝචිත කාලය තුල සාමාජික ජී. රත්නායක මහතා, 2018. 03.27 දින ඉල්ලා අස් විය.

## මූල්‍ය වාර්තාකරණය

අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇති වගකීම් ප්‍රකාරව අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් ආයතනයේ මූල්‍ය වාර්තාකරණය අධීක්ෂණය කිරීමත්, මූල්‍ය ප්‍රකාශනය සමාලෝචනය කිරීමත්, එය ප්‍රකාශයට පත් කිරීමට ප්‍රථම විවාදයට ලක් කර අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීමත් සඳහා කමිටුව පිහිටුවා තිබේ.

ගිණුම් ප්‍රතිපත්ති සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ සම්මතවලට අනුකූල වන්නේද යන්න පිළිබඳව සහතික කිරීම සඳහාත් විගණන කමිටුව මූල්‍ය ප්‍රකාශ සමාලෝචනය කිරීමේ නියැලේ.

සමාගමේ මෙහෙයුම් කටයුතු හා අනාගත විභවතා පිළිබඳව කළමනාකාරීත්වය සමඟ කමිටුව නිරන්තරයෙන් සාකච්ඡා කරනු ලබන අතර මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේ දී අදාළ සියලු කාරණා සැලකිල්ලට බඳුන්කර ඇති බවට සහතික වේ.

## පාලනය හා අවදානම

සමාගමේ අභ්‍යන්තර පාලන පද්ධතියේ ඵලදායීතාවය කමිටුව විසින් සමාලෝචනය කරනු ලබයි. කමිටුව විසින් ප්‍රධාන ව්‍යාපාර හා පාලන අවදානම් මෙන් ම ආයතනය තුළ පවතින පාලන පරිසරය පිළිබඳ ඇගයීමක් සිදුකර නිරීක්ෂණය කළ දුර්වලතා සම්බන්ධයෙන් ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයට උපදෙස් දෙනු ලැබේ.

## බාහිර විගණකවරුන්

විගණන කමිටුව විසින් බාහිර විගණන නිලධාරීන්ගේ ස්වාධීනත්වය සහ විගණන ක්‍රියාවලියේ ඵලදායීතාවය ඇගයීමට ලක් කරනු ලබයි.

විගණනයේ විෂය පථයට අදාළව සහ විගණනය අවසානයේ කළමනාකරණ ලිපිය සාකච්ඡා කිරීම සඳහා කමිටුව බාහිර විගණකවරුන් හමුවෙයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිතීන් සමඟ පවතින අනුකූලතාවය සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කිරීමේ වගකීම දරන බාහිර විගණකවරුන් සමඟ විගණනයට ලක් කළ මූල්‍ය ප්‍රකාශ සමාලෝචනය කිරීම ද විගණන කමිටුව විසින් සිදු කරනු ලබයි.

විගණන කමිටුව විසින් විගණන වර්ෂයට අදාළ බාහිර විගණන නිලධාරීන්ගේ ස්වාධීනත්වය සමාලෝචනය කරයි. තවද, ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වන සංශෝධනයට අනුව, 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ ලියාපදිංචි කළ හෝ එසේ සළකනු ලබන හා එකී පනත ප්‍රකාරව රාජ්‍ය හෝ පොදු ව්‍යාපාර හෝ ප්‍රාදේශීය අධිකාරීවල කොටස්වලින් සියයට 50ක් හෝ ඊට වඩා වැඩි ප්‍රමාණයක් එම ආයතන සතු වන විට ඒවායේ විගණන කටයුතු සිදු කිරීමේ වගකීම විගණකාධිපති දෙපාර්තමේන්තුව යටතට ගැනෙන බව අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කරන මහා සභා රැස්වීමේ දී කොටස් හිමියන්ගේ අනුමැතිය ලබා ගැනීමට යටත්ව, 2016/2017 වර්ෂය සඳහා විගණකාධිපති දෙපාර්තමේන්තුවෙන් විගණකවරුන් පත් කිරීම නිර්දේශ කරන ලදී.

## නිගමනය

සමාගමේ මූල්‍ය තත්ත්වය ප්‍රමාණවත් තරම් සමාලෝචනය වී තිබේද යන්න හඳුනා ගැනීමේ දී සමාගමේ බාහිර විගණකවරුන් විසින් සම්පාදනය කළ වාර්තා සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයේ සහතික වීම කමිටුව විසින් සළකා බලනු ලැබේ.

සභාපති - විගණන කමිටුව

28.02.2019

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. PLA/D/GOPL/01/2017 | මබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 19 November 2018

**සීමාසහිත ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගමේ කොටස් හිමියන් වෙත,**

**2018 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව**

වර්ෂ 2018 මාර්තු 31 දින වන විට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය සහ ලාභ හෝ අලාභ සහ අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, කොටස්වල වෙනස්වීම් ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය ඇතුලු 2018 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සීමාසහිත ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගමේ මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීම අවසන් වූ අතර, ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) වගන්තියේ විධිවිධාන අනුගමනය කරමින් මගේ මහ පෙන්වීම යටතේ සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පැහැදිලි කිරීමේ තොරතුරු සාරාංශගත කරන ලදී.

**මූල්‍ය ප්‍රකාශයන් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් වලට අනුකූල වන පරිදි මෙම මූල්‍ය ප්‍රකාශයන් සකස් කිරීම සහ නිවැරදි හා සාධාරණ මතයක් පිළිඹිබු වන පරිදි ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය ("මණ්ඩලය") බැඳී සිටී. තව ද වංචා සහ දෝෂ හේතුවෙන් ගිණිය හැකි තරමේ අවප්‍රකාශයන්ගෙන් තොරව මෙම මූල්‍ය ප්‍රකාශයන් සකස් කිරීමට අවශ්‍ය යැයි තීරණය කරනු ලබන අභ්‍යන්තර සීමාවන් පැනවීම සඳහා ද මණ්ඩලය වගකීමට බැඳී සිටී.

**විගණකවරුන්ගේ වගකීම**

අපගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශයන් පිළිබඳව මතයක් පළ කිරීම අපගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන් වලට අනුකූලව අපි අපගේ විගණනය සිදු කළෙමු. එම ගිණුම්කරණ ප්‍රමිතීන්වලින් අපේක්ෂිත පරිදි අපි ආචාර ධර්මවලට අනුකූල විය යුතු අතර මූල්‍ය ප්‍රකාශ ගිණිය හැකි තරමේ අවප්‍රකාශවලින් තොර බවට ප්‍රමාණවත් තරම් සහතික වන්නට හැකි වන පරිදි විගණනය සැලසුම් කර දියත් කළ යුතුය.

මූල්‍ය ප්‍රකාශ වල දැක්වෙන ප්‍රමාණ සහ හෙළිදරව් කිරීම්වලට අදාළ විගණන සාක්ෂි ලබා ගැනීමේ පිළිවෙත් අනුගමනය කිරීම විගණනයට ඇතුළත් වේ. වංචා හෝ දෝෂ හේතුවෙන් මූල්‍ය ප්‍රකාශවල ගිණිය හැකි තරමේ අවප්‍රකාශයන් අඩංගු වීමේ අවදානම ඇගැයීම ද ඇතුළුව, එසේ තෝරාගනු ලබන ක්‍රියා පිළිවෙත් විගණකවරුන්ගේ විනිශ්චය මත රඳා පවතී. එවැනි අවදානම් ඇගයීමේ දී, පවතින තත්ත්වයන්ට යෝග්‍ය වන පරිදි විගණන ක්‍රියා පිළිවෙත් සැලසුම් කිරීම සඳහා සත්‍ය හා සාධාරණ මතයක් පිළිඹිබු වන ප්‍රකාශ සකස් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් විගණකවරයාගේ සැළකිල්ලට බඳුන් වේ. එනමුත් එය ආයතනයේ අභ්‍යන්තර පාලනයන්වල ඵලදායීතාවය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම සඳහා නොවේ. විගණනයේ දී අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්තිවල යෝග්‍ය බව, මණ්ඩලය සිදු කළ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණ බව හා මූල්‍ය ප්‍රකාශ වල සමස්ත ඉදිරිපත් කිරීම ඇගයීම යනාදිය ද විගණනයට ඇතුළත් වේ.මා විසින් විගණනය සඳහා ලබා ගත් සාක්ෂි මාගේ විගණන මතය ඉදිරිපත් කිරීම සඳහා ප්‍රමාණවත් වූ අතර ම විගණනය සඳහා උචිත පදනමක් සපයනු ලැබූ බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.auditorgeneral.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

**සුදුසුකම් ලත් මතයක් සඳහා පදනම**

අ). පරිපාලනය සහ අනෙකුත් පොදු කාර්ය වියදම් රු.95,977,641 ක් ශ්‍රී ලංකාවේ විගණන ප්‍රමිතිවල (LKAS 16) 19 වන කොටසට පටහැනිව ස්කාගාර හා කර්මාන්තශාලා ඉදිකිරීම සඳහා කරන ලද වියදම් සමඟ ප්‍රාග්ධනීකරණය කර ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ස්කාගාරයේ හා ගොඩනැගිල්ලේ පිරිවැය සමාන ප්‍රමාණයකින් වැඩි කර දක්වා ඇත.

ආ). සමාලෝචනයට භාජනය වූ වර්ෂය අවසානයේදී සමාගම විසින් භාවිත කරන සම්පූර්ණයෙන් ක්ෂය වූ දේපල, පිරියත සහ උපකරණවල පිරිවැය රු.78,883,433 කි. කෙසේ වෙතත්, එවැනි වත්කම්වල ඵලදායී ආයු කාලය සමාලෝචනය කිරීමට හා ඒ අනුව ඒවා ගිණුම්ගත කිරීමට පියවර ගෙන නොතිබූ නි.

**සුදුසුකම් ලත් මතය**

සුදුසුකම් ලත් මතයක් සඳහා පදනමෙහි විස්තර කර ඇති කරුණු වල බලපෑම හැරුණු කොට, 2018 මාර්තු 31 වන දින සඳහා වූ මූල්‍ය ප්‍රකාශය තුළින් සමාගමේ මූල්‍ය තත්ත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු වන බවත් එදිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලවන බවත් මාගේ මතය වේ.

**කරුණු අවධාරණය කිරීම**

5 වන සටහනේ මූල්‍ය ප්‍රකාශන වෙත මම අවධානය යොමු කරමි, එමඟින් ද්‍රව්‍යමය අවිනිශ්චිතතාවයේ පැවැත්ම විස්තර කර ඇති අතර එමඟින් සමාගමට ඉදිරියට යාමේ හැකියාව පිළිබඳව සැලකිය යුතු සැකයක් මතු විය හැකිය.

**වෙනත් නීති හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2007 අංක 07 දරන සමාගම් පනතේ 163(2) කොටසින් අපේක්ෂිත පරිදි පහත සඳහන් දෑ දක්වමි.

අ) විගණන මතය ඉදිරිපත් කිරීමේ පදනම, විෂයපථය හා සීමා ඉහත දක්වා ඇති පරිදි වේ.

ආ) මාගේ මතය අනුව;

- සුදුසුකම් ලත් මතයක් සඳහා පදනමෙහි විස්තර කර ඇති කරුණු වල බලපෑම හැරුණු කොට, විගණනය සඳහා අවශ්‍ය කළ සියලුම තොරතුරු සහ පැහැදිලි කිරීම් ලබාගෙන ඇත. මාගේ පිරික්සුමෙන් පෙනෙන්නට ඇති පරිදි සමාගම විසින් විධිමත් ගිණුම්කරණ වාර්තා තබා ඇත.
- සමාගමේ මූල්‍ය වාර්තා 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 කොටසේ අවශ්‍යතාවන්ට අනුකූලව පවතී.

**පාර්ලිමේන්තුවට වාර්තා කිරීම**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) වගන්තියේ විධිවිධාන අනුව පාර්ලිමේන්තුවට මා ඉදිරිපත් කළ වාර්තාව නියමිත වේලාවට සභාගත කරනු ඇත.

එච්. එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති

# ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

## ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම

## ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

| *මාර්තු 31න් අවසන් වර්ෂය සඳහා,* | Note | 2018 (රු) | 2017 (රු) |
|---|---|---|---|
| අයභාරය | 6 | **1,243,023,570** | 1,007,844,863 |
| විකුණුම් පිරිවැය | | **(957,558,213)** | (809,917,686) |
| **දළ ලාභය** | | **285,465,357** | 197,927,176 |
| අනෙකුත් ආදායම් | 7 | **41,371,403** | 40,741,651 |
| පරිපාලන වියදම් | | **(476,285,540)** | (453,648,208) |
| මූල්‍ය ආදායම් | | **30,210** | 38,302 |
| මූල්‍ය වියදම් | | **(1,193,519,762)** | (747,416,480) |
| ශුද්ධ මූල්‍ය වියදම් | 8 | **(1,193,489,552)** | (747,378,178) |
| **බදුවලට පෙර පාඩුව** | 9 | **(1,342,938,332)** | (962,357,558) |
| ආදායම් බදු වියදම් | 10 | **(4,589,788)** | (4,588,763) |
| **වර්ෂය සඳහා පාඩුව** | | **(1,347,528,120)** | (966,946,320) |
| **අනෙකුත් විස්තීර්ණ ආදායම්** | | | |
| නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම මත ආයු ගණක ලාභය හෝ පාඩුව | | **(4,911,133)** | 10,151,857 |
| බදුවලට පෙර අනෙකුත් විස්තීර්ණ ආදායම | | **(4,911,133)** | 10,151,857 |
| **වර්ෂය සඳහා පූර්ණ විස්තරාත්මක ආදායම** | | **(1,352,439,253)** | (956,794,464) |
| **කොටසකට පාඩුව (රුපියල්)** | 11 | **13.32** | 9.56 |

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල වැදගත් අංගයන් වේ.

වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යාවලින් අඩු කිරීම් දක්වයි.

# මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

**ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම**

**මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**

| මාර්තු 31න් අවසන් වර්ෂය සඳහා, | සටහන් | 2018 (රු) | 2017 (රු) |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත සහ උපකරණ | 12 | | 935,098,754 |
| යටිතල පහසුකම් සංවර්ධනය | 13 | **61,269,718** | 61,828,803 |
| ඉඩම් හා ගොඩනැගිලි භාවිත කිරීමේ අයිතිය | 14 | **245,000,000** | 254,800,000 |
| ප්‍රාග්ධන නොනිමි වැඩ | 15 | **11,002,668** | 917,454,669 |
| අස්පෘශ්‍ය වත්කම් | 16 | **1,304,326** | 336,915 |
| ගොවීන්ට ලබා දුන් ණය | 17 | **113,960,321** | 76,954,791 |
| | | **432,537,033** | 2,246,473,932 |
| **ජංගම වත්කම්** | | | |
| ජෛව විද්‍යාත්මක වත්කම් | 18 | **20,710,760** | 22,176,331 |
| තොග | 19 | **719,275,368** | 412,739,304 |
| ගොවීන්ට ලබා දුන් ණය | 17 | **176,165,585** | 240,734,439 |
| **වෙළෙඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ** | 20 | **122,824,008** | 225,931,731 |
| අනුබද්ධ පාර්ශ්වයන්ගෙන් ලැබිය යුතු ප්‍රමාණ | 21 | **2,772,105** | 2,376,396 |
| ආපසු ලැබිය යුතු ආදායම් බදු | | **2,579,077** | 689,877 |
| මුදල් සහ ඒ සමාන දෑ | 22 | **5,509,030** | 847,032 |
| **මුළු ජංගම වත්කම්** | | **1,049,835,933** | 905,495,109 |
| **මුළු වත්කම්** | | **1,482,372,967** | 3,151,969,042 |
| **හිමිකම් හා වගකීම්** | | | |
| **හිමිකම්** | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 23 | **1,011,764,730** | 1,011,764,730 |
| සමුච්චිත අලාභය | | **(5,429,166,673)** | (4,076,727,421) |
| **මුළු හිමිකම්** | | **(4,417,401,944)** | (3,064,962,691) |
| **ජංගම නොවන වගකීම්** | | | |
| පොළී සහිත ණය හා ණය ගැනුම් | 25 | **3,702,703,173** | 2,969,408,753 |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් | 24 | **39,401,774** | 27,328,453 |
| මූල්‍ය කල්බදු බැඳීම් | 26 | **170,113,017** | 96,466,944 |
| **මුළු ජංගම නොවන වගකීම්** | | **3,912,217,964** | 3,093,204,149 |
| **ජංගම වගකීම්** | | | |
| පොළී සහිත ණය හා ණය ගැනුම් | 25 | **2,848,358,129** | 2,367,141,659 |
| මූල්‍ය කල්බදු බැඳීම් | 26 | **37,943,951** | 19,147,034 |
| වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ | 27 | **168,496,162** | 76,695,189 |
| අනුබද්ධ පාර්ශ්වයන්ට ගෙවිය යුතු ප්‍රමාණ | 28 | **886,548,864** | 410,167,275 |
| ගෙවිය යුතු ආදායම් බදු | | **-** | - |
| බැංකු අයිරා | 22 | **166,507,964** | 250,576,425 |
| **මුළු ජංගම වගකීම්** | | **4,107,855,070** | 3,123,727,584 |
| **මුළු හිමිකම් හා වගකීම්** | | **3,602,671,091** | 3,151,969,042 |

*ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල වැදගත් අංගයන් වේ. වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යාවලින් අඩු කිරීම් දක්වයි.* මෙම මූල්‍ය ප්‍රකාශය 2007 අංක 07 දරන සමාගම් පනතේ අවශ්‍යතාවයන්ට අනුකූල බව මම සහතික කරමි.

**මූල්‍ය ප්‍රධානී**
(එම්.වී.සාලිය ප්ලේවියන්)

**මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම හා ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම් වේ. අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා සහ වෙනුවෙන් අනුමත කොට අත්සන් කරන ලදී;**

**අධ්‍යක්ෂ**
(ආර්.එම්.ජී.කේ. බී. රත්නායක)
2018 ජුලි 24

**අධ්‍යක්ෂ**
(ගිරිදරන් සීනිවාසන්)

# හිමිකම් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය

**ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම**

**හිමිකම් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය**

| | ප්‍රකාශිත ප්‍රාග්ධනය (රු) | රඳවාගත් ඉපැයුම් (රු) | එකතුව (රු) |
|---|---|---|---|
| 2016 අප්‍රේල් 01 දිනට ශේෂය | 1,011,764,730 | (3,119,932,957) | (2,108,168,227) |
| වර්ෂය සඳහා අලාභය | - | (966,946,320) | (966,946,320) |
| වර්ෂය සඳහා අනෙකුත් විස්තීර්ණ ආදායම් | - | 10,151,857 | 10,151,857 |
| වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම් | - | (956,794,464) | (956,794,464) |
| **2017 මාර්තු 31 දිනට ශේෂය** | **1,011,764,730** | **(4,076,727,421)** | **(3,064,962,691)** |
| වර්ෂය සඳහා අලාභය | - | **(1,347,528,120)** | **(1,347,528,120)** |
| වර්ෂය සඳහා අනෙකුත් විස්තීර්ණ ආදායම් | - | **(4,911,133)** | **(4,911,133)** |
| වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම් | **-** | **(1,352,439,253)** | **(1,352,439,253)** |
| **2018 මාර්තු 31 දිනට ශේෂය** | **1,011,764,730** | **(5,429,166,673)** | **(4,417,401,943)** |

*ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල වැදගත් අංගයන් වේ.*

*වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යාවලින් අඩු කිරීම් දක්වයි.*

# මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය

<u>ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම</u>

<u>මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය</u>

| මාර්තු 31න් අවසන් වර්ෂය සඳහා, | 2018<br>Rs. | 2017<br>Rs. |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් උපයන ලද මූල්‍ය ප්‍රවාහ** | | |
| බදුවලට පෙර අලාභය | **(1,342,938,332)** | (962,357,558) |
| ***පහත සඳහන් කරුණු වෙනුවෙන් ගැලපීම්:*** | | |
| මූල්‍ය ආදායම් | **(30,210)** | (38,302) |
| මූල්‍ය වියදම් | **1,193,519,762** | 747,416,480 |
| දේපළ පිරියත හා උපකරණ මත ක්ෂය | **185,070,757** | 158,138,250 |
| අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය කිරීම | **340,297** | 48,265 |
| කල්බදු අයිතිය ක්‍රමක්ෂය කිරීම | **9,800,000** | 9,800,000 |
| යටිතල පහසුකම් සංවර්ධන උපකරණ මත ක්‍රමක්ෂය කිරීම | **36,199,707** | 44,558,855 |
| ගොවි ණය කපා හැරීම | **-** | 5,559,643 |
| විශ්‍රාම පාරිතෝෂික සඳහා වෙන් කිරීම් | **9,397,592** | 7,761,632 |
| **කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය** | **91,359,572** | 10,887,265 |
| **කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම** | | |
| තොග අඩුවීම්/(වැඩිවීම්) | **(306,536,064)** | (59,178,967) |
| ජෛව වත්කම් අඩුවීම්/(වැඩිවීම්) | **1,465,571** | (6,443,056) |
| වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දැවල වැඩිවීම | **103,107,722** | (74,505,013) |
| අනුබද්ධ පාර්ශවයන්ගෙන් ලැබිය යුතු දැවල අඩුවීම්/(වැඩිවීම්) | **(395,709)** | (587,915) |
| ගොවීන්ට ලබා දුන් ණය අඩුවීම්/(වැඩිවීම්) | **27,563,325** | (85,151,733) |
| වෙළඳ සහ අනෙකුත් ගෙවියයුතු දැවල වැඩිවීම්/(අඩුවීම්) | **91,800,973** | (51,381,717) |
| අනුබද්ධ පාර්ශවයන් වෙත ගෙවියයුතු දැවල අඩුවීම්/(වැඩිවීම්) | **97,104,483** | - |
| **මෙහෙයුම්වලින් ජනනය වූ මුදල්** | **105,469,872** | (266,361,136) |
| ආදායම් බදු ගෙවීම් | **(6,478,988)** | (8,131,826) |
| විශ්‍රාම පාරිතෝෂික ගෙවීම් | **(2,235,404)** | (774,759) |
| ගෙවූ මූල්‍ය වියදම් | **(814,242,656)** | (664,968,777) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලැබුණු/ (භාවිතා වූ) ශුද්ධ මූල්‍ය ප්‍රවාහය** | **(717,487,176)** | (940,236,498) |
| **ආයෝජන ක්‍රියාකාරකම් තුළින් ජනනය වූ මූල්‍ය ප්‍රවාහය** | | |
| ලැබුණු පොළී ආදායම් | **30,210** | 38,302 |
| දේපළ, පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම් | **(1,370,270,128)** | (165,389,380) |
| අස්පෘශ්‍ය වත්කම් අත්පත් කර ගැනීම් | **(1,307,708)** | (70,000) |
| යටිතල පහසුකම් නවාංග | **(35,640,622)** | (34,673,774) |
| ඉදිරියට යන ප්‍රාග්ධන ක්‍රියාකාරකම්වල ආයෝජන | **906,452,001** | (515,661,706) |
| **ආයෝජන ක්‍රියාකාරකම් තුළ භාවිතා වූ ශුද්ධ මූල්‍ය ප්‍රවාහය** | **(500,736,246)** | (715,756,558) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් ජනනය වූ මූල්‍ය ප්‍රවාහය** | | |
| බදු වගකීම් වල ශුද්ධ වැඩිවීම්/(අඩුවීම්) | **92,442,990** | 85,748,702 |
| අනුබද්ධ සමාගම්වලින් ණයට ගැනුම්වලින් ලැබීම් | **1,335,919,008** | 2,547,200,614 |
| අනුබද්ධ සමාගම්වලට ණය ආපසු ගෙවීම් | **(244,985,645)** | (877,342,544) |
| අනුබද්ධ නොවන සමාගම්වලින් ණය ගැනුම් වලින් ලැබීම් | **200,927,371** | 2,483,100 |
| අනුබද්ධ නොවන සමාගම්වලට ණය ආපසු ගෙවීම් | **(77,349,844)** | (134,100,133) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් ජනනය වූ ශුද්ධ මූල්‍ය ප්‍රවාහය** | **1,306,953,880** | 1,623,989,738 |
| වසර තුළ මුදල් හා ඊට සමාන වෙනත් දෑ වල ශුද්ධ වෙනස්වීම් | **88,730,457** | (32,003,319) |
| වසර ආරම්භයේ දී පැවති මුදල් හා ඊට සමාන වෙනත් දෑ | **(249,729,394)** | (217,726,074) |
| **වසර අවසානයේ මුදල් හා ඊට සමාන වෙනත් දෑ (සටහන 22)** | **(160,998,935)** | (249,729,394) |

***ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල වැදගත් අංගයන් වේ. වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යාවලින් අඩු කිරීම් දක්වයි.***

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

**ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම**
**මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්**

## 1. ආයතනික තොරතුරු

### 1.1 වාර්තා කරන ස්ථීතිය
ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම යනු 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ 2006 වසරේ ඔක්තෝබර් 11 දින ස්ථාපනය කරන ලද සීමාසහිත වගකීම් දරන ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ සමාගමකි. සමාගමේ ලියාපදිංචි කාර්යාලය අංක 481, ටී.බී. ජයා මාවත, කොළඹ 10 යන ලිපිනයේ පිහිටා ඇති අතර සමාගමේ ව්‍යාපාරික කාර්යාලය හිඟුරානේ කර්මාන්තශාලා සංකීර්ණයේ පිහිටා ඇත.

### 1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් ස්වභාවය
සමාගම සීනි සහ මොලෑසස් නිෂ්පාදනයේ සහ විදුලි බලය උත්පාදනයේ නිරතව සිටියි.

### 1.3 ආසන්නතම සහ අවසාන පරිපාලක ව්‍යවසාය
සමාගමේ ප්‍රධාන කොටස් හිමිකරු වන්නේ 2018 මාර්තු 31 දිනට සාමාන්‍ය කොටස් වලින් 51% කට හිමිකම් කියන ශ්‍රී ලංකා රජයයි. අප සමාගම බ්‍රවුන්ස් සහ සමාගමේ (පී.එල්.සී.) සහ ලංකා ඔරික්ස් ලීසිං (පී.එල්.සී.) සමාගමේ හවුල්කාර ආයතනයකි. 2018 මාර්තු 31 දින වන විට ලංකා ඔරික්ස් ලීසිං සමාගම (පී.එල්.සී.) සතුව සාමාන්‍ය කොටස් 26.95%ක් ද බ්‍රවුන්ස් සහ සමාගම (පී.එල්.සී.) සතුව සාමාන්‍ය කොටස් 22.05% ක් ද පැවතිණි.

### 1.4 නිකුත් කිරීම සඳහා බලය පවරන දිනය
2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමාසහිත ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගමේ මූල්‍ය ප්‍රකාශ (සංසන්දන සහිතව) නිකුත් කිරීමට වර්ෂ 2018ක් වූ ජූලි මස 24 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාව පරිදි බලය පැවරී ඇත.

## 2. මූල්‍ය ප්‍රකාශ සැකසීමේ පදනම

### 2.1 අනුකූලතාවය පිළිබඳ ප්‍රකාශය
සමාගමෙහි මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, ලාභ අලාභ සහ අනෙකුත් විස්තීර්ණ ආදායම් පිළිබඳ ප්‍රකාශය, හිමිකම් වෙනස් වීම පිළිබඳ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය හා ඊට අදාළ සටහන් යනාදියෙන් සමන්විත සමාගමේ මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා වරළත් ගණකාධිකාරීන්ගේ ආයතනය නියම කළ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS සහ SLFRS) වලට අනුව සහ 2007 අංක 07 දරන සමාගම් පනතට අනුකූලව සකස් කොට ඇත.

### 2.2 ගිණුම්කරණ පදනම
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි දක්වා ඇති පහත සඳහන් භෞතික අයිතම ගණනය කිරීමේ දී හැරුණු විට සමාගමෙහි මූල්‍ය ප්‍රකාශය ඓතිහාසික පිරිවැය ක්‍රමය අනුව සකස් කර ඇත.

- ජීව විද්‍යාත්මක වත්කම් (දැනට වගා කර ඇති උක්) ගණනය කරනු ලබන්නේ සාධාරණ අගයෙන් විකුණුම් පිරිවැය අඩු කිරීමෙනි.
- විශ්‍රාම ප්‍රතිලාභ බැදීම් ගණනය කරනු ලබන්නේ අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ බැඳීම්වල වර්තමාන වටිනාකම අනුව ය.

### 2.3 කෘත්‍යාත්මක ව්‍යවහාර මුදල

සමාගමේ කෘත්‍යාත්මක ව්‍යවහාර මුදල වන ශ්‍රී ලංකා රුපියල් වලින් මෙම මූල්‍ය ප්‍රකාශය ඉදිරිපත් කර ඇත. ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති සියලු මූල්‍ය තොරතුරු ආසන්න රුපියලට වටයා ඇත.

### 2.4 ගිණුම්කරණ ඇස්තමේන්තු, විනිශ්චයන් සහ උපකල්පන භාවිතය

ශ්‍රී ලංකා වරළත් ගණකාධිකාරීන්ගේ ආයතනය නිකුත් කළ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS සහ SLFRS) වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කරන විට ගිණුම්කරණ ප්‍රතිපත්ති උපයෝගී කර ගැනීම සහ ප්‍රකාශිත ආදායම, වියදම, වත්කම් සහ වගකීම් ප්‍රමාණයන් කෙරෙහි බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පනයන් කිරීමට කළමනාකාරිත්වයට සිදු වේ. මෙම ඇස්තමේන්තුවලට වඩා සත්‍ය ප්‍රතිඵල වෙනස් විය හැකිය. ඇස්තමේන්තු සහ උපකල්පනයන් ඓතිහාසික අත්දැකීම් සහ විවිධ හේතු මත සාධාරණ යැයි හැඟෙන වෙනත් සාධක මත පදනම්ව සිදු කරන ඒවා වේ. එබැවින්, සැබෑ අත්දැකීම් හා ප්‍රතිඵල මෙම විනිශ්චයන් සහ උපකල්පනයන්ට වඩා වෙනස් විය හැකිය.

## ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම

## මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

**අ. ක්ෂයවන වත්කම්වල ඵලදායී ආයු කාලය**

වාර්තා කරනු ලබන සෑම දිනකට ම ක්ෂයවන වත්කමක ඵලදායී ආයු කාලය, එම වත්කමෙහි අපේක්ෂිත උපයෝගීතාවය මත පදනම් වෙමින් කළමනාකාරිත්වය විසින් ඇස්තමේන්තු ගත කරයි. සමහර දේපළ, පිරියත හා උපකරණවල ඵලදායී ජීව කාලය වෙනස් වීමට තුඩු දිය හැකි තාක්ෂණික යල් පැනීම් මෙම ඇස්තමේන්තුවල පවත්නා අවිනිශ්චිතතාවන් හා සබැඳේ.

**ආ. විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් ගණනය කිරීම**

විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් පිළිබඳ කළමනාකාරිත්වයේ ඇස්තමේන්තුව, ඒ හා බැඳුනු උද්ධමන අනුපාතිකය, මරණ අනුපාතිකය, වට්ටම් අනුපාතිකය සහ අනාගත වැටුප් වැඩිවීම් අපේක්ෂා කිරීම යනාදී තීරණාත්මක උපකල්පනයන් රැසක් මත පදනම්ව ඇත. මෙම උපකල්පණයන් හි වෙනස්වීම් නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් ප්‍රමාණය සහ වාර්ෂික නිශ්චිත ප්‍රතිලාභ වියදම් සඳහා, තීරණාත්මක ලෙස බලපානු ඇත.

**ඇ. ජීව විද්‍යාත්මක වත්කම්**

දැනට වගා කර ඇති උක්වල සාධාරණ වටිනාකම මැනීමේදී කළමනාකාරිත්වය එය ඇස්තමේන්තු කරන අතර සාධාරණ වටිනාකම නිර්ණය කිරීම සඳහා විනිශ්චය අවශ්‍ය වේ. වගා කර ඇති උක්වල වෙළඳපල මිල දේශීය වෙළඳපොලෙන් ලබා ගන්නා අතර සමාගම වගා කර ඇති උක්වල ගුණාත්මය සහ බර ආසන්න වශයෙන් ගණනය කරනු ලැබේ.

**ඈ. හානිකරණය**

හානිවීම් ගණනය කිරීමේ දී සෑම වත්කමකින් ම හෝ මුදල් උත්පාදනය කරන ඒකකයකින් අයකර ගත හැකි ප්‍රමාණය අනාගතයේ දී අපේක්ෂා කරනු ලබන මූල්‍ය ප්‍රවාහය මත පදනම් වන අතර ඒවා වට්ටම් කිරීම සඳහා සුදුසු පොළී අනුපාතිකයන් භාවිතා කරයි. අනාගත මෙහෙයුම් ප්‍රතිඵල පුරෝකථනය කිරීමේ දී කළමනාකාරිත්වය ස්වකීය විනිශ්චයන් මත පදනම් වෙමින් සමහර උපකල්පන වලට එළඹේ.

### 2.5 ප්‍රවර්තන (අඛණ්ඩ) ව්‍යාපාරයක් ලෙස සැලකීම

සමාගම ප්‍රවර්තන ව්‍යාපාරයක් ලෙස පවත්වාගෙන යාමට ඇති හැකියාව පිළිබඳව අධ්‍යක්ෂවරුන් තක්සේරු කර ඇති අතර පුරෝකථනය කළ හැකි අනාගතයක් සඳහා ප්‍රමාණවත් තරම් සම්පත් පවතින බවට ද සෑහීමට පත් වේ. එබැවින් මෙම මූල්‍ය ප්‍රකාශ ව්‍යාපාරික අඛණ්ඩ බව සැළකිල්ලට ගෙන සකස් කර ඇත.

### 3. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති ආයතනය විසින් මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කර ඇති සෑම කාල වකවානුවක දී ම එකසේ භාවිතා කර තිබේ.

### 3.1 විදේශ විනිමය ගනුදෙනු

විදේශ මුදල් වලින් කෙරෙන ගනුදෙනු, ගනුදෙනු කටයුතු සිදුවන දිනය වන විට පවතින විදේශ විනිමය අනුපාතිකය අනුව ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කෙරේ. ශේෂ පත්‍ර දිනට විදෙස් මුදල් වලින් පවත්නා සියලුම මූල්‍ය වත්කම් සහ වගකීම් තත්කාලීනව බලපවත්නා වූ විදේශ විනිමය අනුපාතිකය අනුව ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කෙරේ. මූල්‍ය වත්කම් මත සිදුවන විදේශ මුදල් ලාභ හෝ පාඩුව වන්නේ වාර්තා කරනු ලබන කාල වකවානුව ආරම්භයේ පවතින ව්‍යවහාර විනිමය ක්‍රමක්ෂය කිරීමේ දී හා වාර්තා කරනු ලබන කාල වකවානුව අවසානයේ දී පැවති විදේශ විනිමය අනුපාතිකය අනුව ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කර ක්‍රමක්ෂය කිරීමේ දී සිදු වන වෙනස යි.

විදෙස් මුදල්වල ඓතිහාසික පිරිවැය මත ගණනය කරනු ලබන විදේශ මුදල් වලින් නම් කර ඇති මූල්‍ය නොවන වත්කම් සහ වගකීම් මුල් ගනුදෙනුව සිදු කළ දිනයේ දී පැවති විදේශ විනිමය අනුපාතිකයට අනුව ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කෙරේ. සාධාරණ අගය මත ගණනය කරනු ලබන විදෙස් මුදල්වලින් නම් කර ඇති මූල්‍ය නොවන වත්කම් හා වගකීම් සාධාරණ අගය නිර්ණය කරනු ලබන දිනට බලපවත්නා වූ අනුපාතිකය අනුව ප්‍රතිපරිවර්තනය කරනු ලැබේ.

එලෙස විදෙස් මුදල් ප්‍රතිපරිවර්තනය කිරීමේදී ඇතිවන විදෙස් මුදල් ඌනතා ලාභාලාභ ප්‍රකාශනයෙහි දක්වයි. විදෙස් විනිමය ලැබීම් හෝ පාඩු ශුද්ධ පදනමින් ලාභාලාභ ගිණුමේ සටහන් කරනු ලබයි.

**ගල්ඔය වැව්ලි (පුද්ගලික) සමාගම**

**මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්**

## 3.2 වත්කම් හා ඒවා ඇගයීමේ පදනම

### 3.2.1. දේපළ, පිරියත හා උපකරණ

#### 3.2.1.1 හඳුනා ගැනීම සහ මැනීම

දේපළ, පිරියත හා උපකරණවල සමුච්චිත ක්ෂය හෝ සමුච්චිත හානිකරණය පිරිවැයෙන් අඩු කොට ගණනය කර ඇත. වත්කම් මිල දී ගැනීමට දැරූ වියදම හා ඒවා මිල දී ගැනීම මඟින් අපේක්ෂා කරන ලද භාවිතාවන් වලට යෝග්‍ය තත්ත්වයට ගෙන ඒම සඳහා දැරූ සෘජු වියදම් දේපළ, පිරියත හා උපකරණවල පිරිවැයට ඇතුළත් වේ. ස්වයං නිෂ්පාදිත වත්කමක් නම් එය අදාළ කාර්යයට සුදුසු තත්ත්වයට ගෙන ඒමට දැරූ හඳුනා ගත හැකි සියලු පිරිවැය එනම් ද්‍රව්‍ය, සෘජු ශ්‍රමය යනාදිය සඳහා දැරූ වියදම් ඇතුළත් වේ. මේ සඳහා කොටස් ගැලවීමට, ඉවත් කිරීමට සහ උපකරණ ස්ථාපිත කර ඇති ස්ථානයේ නැවත ප්‍රතිස්ථාපනය කිරීමට යන වියදම ද ඇතුළත් වේ.
සියලු දේපළ, පිරියත හා උපකරණ ආරම්භයේ දී පිරිවැය මත හඳුනාගනු ලැබේ.

#### 3.2.1.2 ආයතික පිරිවැය

දේපළ, පිරියත හා උපකරණවල ධාරණ ප්‍රමාණය සමාගම විසින් හඳුනාගනු ලබන්නේ යම් අයිතමයක කොටසක් ප්‍රතිස්ථාපනය කිරීමේ දී එම අයිතමය මඟින් මූර්තිමත්වන අනාගත ආර්ථික ප්‍රතිලාභ සමාගම වෙත ලැබෙන බව පෙනෙන විට දී හා ඊට දැරිය යුතු වියදම විශ්වසනීය ලෙස මිණිය හැකි විටදී ය. ප්‍රතිස්ථාපනය කරනු ලබන කොටස්වල ධාරණ ප්‍රමාණ එම වත්කම්වල පිරිවැයෙන් හඳුනා ගනී. ලාභලාභ ප්‍රකාශය මඟින් දේපළ, පිරියත හා උපකරණ සඳහා දරා ඇති දෛනික සේවා වියදම් හඳුනා ගනු ලබයි.

#### 3.2.1.3 වත්කම් ලෙස හඳුනා නොගැනීම

ආරම්භයේ දී දේපළ, පිරියත හා උපකරණ සහ ඕනෑම වැදගත් කොටසක් ලෙස හඳුනාගත් අයිතමයන් බැහැර කිරීමේ දී හෝ බැහැර කිරීම හෝ භාවිතා කිරීම තුළින් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරන අවස්ථාවලදී ඒවා වත්කම් ලෙස හඳුනා නොගනී. එසේ වත්කම් ලෙස හඳුනා නොගනී නම් එතුළින් ජනනය වන ඕනෑම ලාභයක් හෝ පාඩුවක් (වත්කමේ ධාරණ ප්‍රමාණය හා ශුද්ධ බැහැර කිරීම් අතර වෙනස මඟින් ගණනය කරනු ලැබේ) විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ ඇතුළත් කරනු ලැබේ. වත්කමේ ශේෂ වූ වටිනාකම, ජීව කාලය සහ ක්ෂය කිරීමේ ක්‍රමවේදය සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේ දී ම සමාලෝචනය කරන අතර පෙරදිසි මූල්‍ය ප්‍රකාශය සමඟ යෝග්‍ය පරිදි ගලපනු ලබන්නේ, තීරකයන් වෙත ලබා දෙන මූල්‍ය ප්‍රකාශයෙහි ඉදිරිපත් කරන තොරතුරුවල අදාළතාවය හා විශ්වසනීයත්වය ඉහළ නැංවීමට ය.

#### 3.2.1.4 ක්ෂය වීම්

වත්කමක පිරිවැය, එහි ශේෂ වටිනාකමින් අඩු කිරීම මත ගණනය කරනු ලැබේ. දේපළ, පිරියත හා උපකරණවල සෑම උපාංගයක ම ක්ෂයවීම් සරළ මාර්ග ක්‍රමය අනුව ඇස්තමේන්තුගත සඵල කාලය සඳහා ලාභාලාභ ප්‍රකාශය තුළ හඳුනා ගැනේ. යම් වත්කමක ක්ෂයවීම ආරම්භ වන්නේ එම වත්කම ප්‍රයෝජනයට ගැනීමට යෙද වූ දින සිටය. ක්‍ෂයවීම අවසන් වන්නේ එය බැහැර කරන මුල්ම දින සිටය. කල්බදු කාලය අවසන් වීමත් සමඟම, සමාගම නිශ්චිතවම වත්කමේ හිමිකරු වන බව දන්නා විට හැරෙන්නට කල්බදු යටතේ ඇති වත්කම් කල්බදු කාලය හෝ සඵල ආයු කාලය යන දෙකෙන් කෙටි කාලය පුරාවට ක්‍ෂයවීම් ගණනය කරනු ලැබේ. කේවල වත්කම්වල වැදගත් අංගවල වටිනාකම තක්සේරු කරන අතර, වත්කමක අවශේෂ වලට වඩා යම් අංගයක සඵල කාලය වෙනස් වේ නම්, එම අංගයේ ක්ෂය වීම් වෙනම ගණනය කරනු ලැබේ.

## ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම

## මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

දේපළ, පිරියත හා උපකරණවල ඇස්තමේන්තු ගත සඵල ආයු කාලය පහත පරිදි වේ.

| දේපළ, පිරියත හා උපකරණ | වසර ගණන |
|---|---|
| ගොඩනැගිලි | වසර 30 |
| කර්මාන්ත ශාලාවේ පිරියත හා යන්ත්‍ර | වසර 12 |
| යන්ත්‍රෝපකරණ ගොණුව | වසර 04 |
| ජල පිරිපහදු ඒකකය | වසර 12 |
| ගෘහ භාණ්ඩ හා මෙවලම් | වසර 05 |
| කාර්යාල උපකරණ | වසර 04 |
| කෘෂි උපකරණ සහ ආම්පන්න | වසර 08 |
| නිල නිවාසවල උපකරණ | වසර 08 |
| කර්මාන්ත ශාලාවේ උපකරණ | වසර 08 |
| ට්‍රැක්ටර් සහ ට්‍රේලර් | වසර 06 |
| උක් නෙළන යන්ත්‍ර | වසර 04 |
| යතුරු පැදි | වසර 04 |
| පරිගණක උපකරණ | වසර 04 |
| ජංගම දුරකථන | වසර 04 |
| ජී පී එස් උපකරණ | වසර 04 |
| අස්පෘශ්‍ය වත්කම් | වසර 04 |
| ස්කාගාරය හා යන්ත්‍රෝපකරණ | වසර 20 |

### 3.2.1.5 ක්‍රමක්ෂය

කල් බදු අයිතීන්, කල් බදු කාලය අවසන් වන කාලය සහ වත්කමෙහි අපේක්ෂිත ඵලදායී ආයු කාලය යන දෙකෙන් කෙටි කාලය පුරාවට සමාන ප්‍රමාණයන්ගෙන් ක්‍රමක්ෂය කරනු ලැබේ.

| වත්කම් පන්තිය | වසර ගණන |
|---|---|
| ඉඩම් | අවුරුදු 30 ට |
| නිත්‍ය ඉඩම් සංවර්ධනය | අවුරුදු 30 ට |

### 3.2.1.6 අස්පෘශ්‍ය වත්කම්

වත්කමට ආරෝපිත වූ අනාගත ආර්ථික ප්‍රතිලාභ සමාගම වෙත ගලා එනු ඇතැයි පෙනෙන විට හා වත්කමෙහි පිරිවැය විශ්වසනීය ලෙස ගණනය කළ හැකි විට එම පිරිවැය මඟින් අස්පෘශ්‍ය වත්කම් ආරම්භයේ දී හඳුනා ගනු ලබයි.

සියලුම පරිගණක මෘදුකාංගවල වියදම් හා දෘඩාංග භාවිතය සඳහා අත්‍යවශ්‍ය වන එමෙන්ම ඒ බව පැහැදිළිව හඳුනා ගත හැකි හා විශ්වසනීය ලෙස මිල කළ හැකි අනාගත ආර්ථික ප්‍රතිලාභ ජනනය කරනු ඇතැයි අපේක්ෂාවෙන් භාවිතා කිරීම සඳහා සමාගම විසින් ලබා ගන්නා බලපත්‍රවල වියදම්, අස්පෘශ්‍ය වත්කම් යටතට ගැනේ. හානිකරණ පාඩු හා සමුච්චිත ක්‍රමක්ෂය කිරීම්වලින් අඩුකර පිරිවැය වශයෙන් මෙම අස්පෘශ්‍ය වත්කම් මූල්‍ය ප්‍රකාශවල ඇතුළත් කරයි.

### 3.2.2 ජෛව වත්කම්

පැළ තවාන හා උක් වගාවන් ජෛව වත්කම් වශයෙන් සැළකේ.

උක් වගාවන්වල වටිනාකම සාධාරණ අගය මත විකුණුම් පිරිවැය අඩුකර ගණනය කරනු ලබන්නේ දේශීය වෙළඳපල ක්‍රියාවලීන් මත පදනම් වෙමින් සහ වෙනස්කම් ප්‍රකාශකිරීම සඳහා අවශ්‍ය අවස්ථාවන්හිදී ගැලපීම් සිදු කිරීමෙන් ය. උක් වගාවන්වල සාධාරණ අගය මත විකුණුම් පිරිවැයට අස්වනු නෙළීම, අස්වනු පැටවීම සහ ප්‍රවාහනය සඳහා වැඩිවන පිරිවැය ඇතුළත් වේ. විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ දැනට වගාකර ඇති උක්වල සාධාරණ වටිනාකමෙහි වෙනස හඳුනාගෙන ඇත.

## ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම

## මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

උක් තවාන් සඳහා ආරම්භක පිරිවැය දැරීමෙන් අනතුරුව සුළු ජීව විද්‍යාත්මක පරිවර්තනයක් සිදු වූ බව සළකා පිරිවැය මත පදනම් වෙමින් තවාන්වල වත්කම් ගණනය කරනු ලැබේ. තව ද එම ජීව විද්‍යාත්මක පරිවර්තනය මිල කෙරෙහි සැළකිය යුතු බලපෑමක් ඇති කරන බවට අපේක්ෂා නොකෙරේ. එම පිරිවැයට ඍජු හා වක්‍ර රෝපණ පිරිවැය ඇතුළත් වේ.

### 3.2.2. ජෛව වත්කම් (තවදුරටත්.....)

වර්ධනය වන පැල තවාන් තවාන් සකස් කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය හා ශ්‍රමය සඳහා දැරූ වියදම සහ අනෙකුත් ඍජු පොදු කාර්ය වියදම්වල යෝග්‍ය අනුපාතිකයන් තවාන් වියදමට ඇතුළත් වේ.

### 3.2.3 ණය ගැණුම් පිරිවැය

අපේක්ෂිත භාවිතය හෝ අලෙවිය සඳහා සූදානම් කිරීමට සැළකිය යුතු කාලයක් වැය වන අත්පත්කර ගැනීම්, ඉදි කිරීම් හෝ වත්කම් සේ භාවිතා කිරීමට යෝග්‍ය දෑ නිෂ්පාදනය කිරීම සඳහා ඍජුව ම දායක වන ණය ගැණුම් පිරිවැය එම වත්කම්වල කොටසක් ලෙස ප්‍රාග්ධනිත කරනු ලැබේ.

එසේ ප්‍රාග්ධනිත නොකරන ණය ගැනීම්වල පිරිවැය අදාළ කාලය තුළ දරන වියදම් ලෙස හඳුනාගෙන විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට බැර කරනු ලැබේ. ප්‍රාග්ධනකරණය සඳහා යෝග්‍ය ණය ගැණුම් පිරිවැය ප්‍රමාණය ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිති අංක – 23: 'ණය ගැනීමේ පිරිවැය' අනුව නිර්ණය කරනු ලැබේ.

ක්ෂේත්‍ර සංවර්ධන කටයුතු සඳහා භාවිතා කරනු ලබන විශේෂිත ණයවලට අදාළ ණය ගැනීමේ වියදම් එම ක්ෂේත්‍රවල පවත්නා නොමේරු වගාවන්වලට දැරූ වියදම් වල කොටසක් ලෙස ප්‍රාග්ධනිත කර ඇත. වාණිජමය අස්වනු නෙළීම සඳහා බෝගය සූදානම්ව පවතින විට දී ප්‍රාග්ධනකරණය නතර කරනු ලැබේ. එලෙස ප්‍රාග්ධනකරණය කළ ප්‍රමාණය හා එහි දී භාවිතා කළ අනුපාතික මූල්‍ය ප්‍රකාශ සටහන් මඟින් අනාවරණය කරනු ලැබේ. අත්පත් කරගැනීම්, ඉදිකිරීම් හෝ වත්කම් සේ භාවිතා කිරීමට යෝග්‍ය දෑ නිෂ්පාදනය කිරීමට ඍජුව ම දායක නොවන ණය ගැනීමේ වියදම් සඵල පොළී ක්‍රමය භාවිතයෙන් ලාභාලාභ ප්‍රකාශය තුළ හඳුනා ගැනේ.

### 3.2.4 ස්ථාවර ඉඩම් සංවර්ධන වියදම්

ස්ථාවර ඉඩම් සංවර්ධන වියදම් යනු සුවිශේෂී යටිතල පහසුකම් සංවර්ධනයේ දී හෝ කල්බදු අයිතිය යටතේ පවතින ඉඩම්වලට නව ප්‍රවේශ මාර්ග ඉදිකිරීමේ දී දැරීමට සිදුවන වියදම්ය.
ඉදිරියට පවතින කල්බදු කාලය සඳහා මෙම වියදම් ක්‍රමක්ෂය කර ප්‍රාග්ධනිත කර තිබේ.

### 3.2.5 අවසන් නොකළ ප්‍රාග්ධන වැඩ

මිල දී ගැනීම් හා ඉදිකිරීම් සඳහා දරන වියදම් සහ ඊට අදාළ අනෙකුත් වියදම් අවසන් නොකළ ප්‍රාග්ධන වැඩ සඳහා වන වියදම් නම් වේ. ස්ථාවර ස්වරූපයෙන් හෝ ව්‍යාපාරයේ ඉපයීම් ධාරිතාව ඉහළ නැංවීම සඳහා ඇරඹූ නමුත් අවසන් නොකළ ප්‍රාග්ධන වැඩ වෙනුවෙන් දැරූ වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස සළකා ඇත.

මෙකී ප්‍රාග්ධන වැඩ පළමු වරට භාවිතා කරන අවස්ථාවේ දී හෝ එම වත්කම සම්බන්ධයෙන් බලය පැවරෙන විට දී අදාළ වත්කම් ගිණුම්වලට ඒවා මාරු කරනු ලැබේ.

### 3.2.6 කල් බදු

#### අ) මූල්‍ය කල් බදු

මූල්‍ය කල්බදු ලෙස වර්ග කරනු ලබන්නේ කල් බදුවල සියලු ලැබීම් හා අවදානම් සමාගම විසින් වැඩි වශයෙන් භාරගනු ලබන කල් බදුය. ආරම්භක හඳුනාගැනීමේ දී, දේපළ පිරියත හා උපකරණ ලෙස පවතින කල්බදු වත්කම් ඒවායේ සාධාරණ අගය හා අවම කල්බදු ගෙවීම් වල වර්තමාන වටිනාකම අතරින් අඩු අගයට අනුව ගණනය කරනු ලබයි. ආරම්භක හඳුනාගැනීමෙන් අනතුරුව, එම වත්කම්වලට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අනුකූල වන පරිදි, එකී වත්කම් ගිණුම්ගත කෙරේ. මූල්‍ය කල්බදු යටතේ ඇති අවම බදු ගෙවීම්, ගෙවිය යුතු වගකීම්වල අඩු කිරීම් සහ මූල්‍ය වියදම් අතර අනුපාතනය කරනු ලැබේ. වගකීම්වල පවත්නා ශේෂය මත නිත්‍ය ආවර්ත පොළී අනුපාතිකයන් පවරනු පිණිස බදු කාලය තුළ දී එළඹෙන සෑම කාලපරිච්ඡේදයක් සඳහා ම මූල්‍ය වියදම් වෙන් කරනු ලැබේ.

## ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම

## මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

**ආ). මෙහෙයුම් කල්බදු**

කල්බදු කාලසීමාව තුළ දී බදු දීමනාකරු විසින් කල් බදුවල සියලු අවදානම් හා ප්‍රතිලාභ වැඩි වශයෙන් හා ඵලදායී ලෙස දරනු ලබන විට ඒවා මෙහෙයුම් කල්බදු ලෙස වර්ග කරනු ලැබේ.

මෙහෙයුම් කල්බදු යටතේ සිදුකරන ගෙවීම් කල්බදු කාලය පුරාවට සරළ මාර්ග ක්‍රමය හෝ කල්බදුවලින් උකහා ගන්නා ප්‍රතිලාභවල කාල රටාව වඩාත් නියෝජනය වන ආකාරයේ වෙනත් පදනමකින් ලාභාලාභ ප්‍රකාශයේ වියදමක් ලෙස හඳුනා ගනු ලැබේ.

### 3.2.7 මූල්‍ය නොවන වත්කම් - හානිකරණය

කිසියම් හානිකරණයක් සිදු වූ බවට සලකුණු පවතී ද යන්න නිර්ණය කිරීම සඳහා සෑම වාර්තාකරණයක දී ම ලේඛනගත භාණ්ඩ හැරුණුකොට සමාගමේ මූල්‍ය නොවන වත්කම්වල ඉදිරියට ගෙන ආ පිරිවැය ප්‍රමාණය සමාලෝචනය කරනු ලැබේ. එවැනි සළකුණු පවතී නම් එම වත්කම්වලින් අත්කර ගත හැකි ප්‍රමාණ ඇස්තමේන්තුගත කරනු ලැබේ. වත්කමක ඉදිරියට ගෙන ආ පිරිවැය ප්‍රමාණය හෝ එහි මුදල් උත්පාදන ඒකකය මඟින් අත්කර ගත හැකි ප්‍රමාණය ඉක්මවා යන විට එය හානිකරණ පාඩුවක් ලෙස හඳුනාගනු ලබයි. මුදල් උත්පාදන ඒකකයක් යනු අනෙකුත් වත්කම්වලින් බොහෝ දුරට ස්වාධීන වූ, මූල්‍ය ප්‍රවාහය ජනනය කරන හඳුනාගත හැකි කුඩාම වත්කම් කාණ්ඩය වේ. හානිකරණ, පාඩු ලාභ අලාභ ප්‍රකාශයේ හඳුනාගැනේ.

### 3.3 මූල්‍ය මෙවලම්

### 3.3.1 මූල්‍ය වත්කම්

සමාගම මූල්‍ය මෙවලම්වල ගිවිසුම්කර ප්‍රතිපාදන වල පාර්ශ්වකරුවෙක් වන විට සමාගමේ මූල්‍ය තත්ව ප්‍රකාශය තුළ මූල්‍ය වත්කම් හඳුනාගනී. වත්කමෙන් ගලා එන මුදල් ප්‍රවාහයන් වල ගිවිසුම්ප්‍රකාර අයිතිය කල් ඉකුත් වූ විට හෝ මූල්‍ය වත්කම්වලට අදාළ මූල්‍ය ප්‍රවාහ ලැබීමට ඇති ගිවිසුම්ප්‍රකාර අයිතිය පවරන ගනුදෙනුවක් හරහා මූල්‍ය වත්කම් ආශ්‍රිත සියලුම අවදානම් හා ලැබීම්වල අයිතිය සැලකිය යුතු තරමින් පවරන විට ඒවා මූල්‍ය වත්කම් ලෙස හඳුනා නොගනී. සමාගම විසින් සකස් කරන ලද හෝ රඳවාගත්, පවරන ලද මූල්‍ය වත්කම් වලට අදාළ ඕනෑම පොලියක්, වෙනම වත්කමක් හෝ වගකීමක් ලෙස හඳුනාගනී. මූල්‍ය වත්කම් හා වගකීම් හිලව් කරනු ලබන අතර අවශ්‍යම අවස්ථාවන් හී දී පමණක් මූල්‍ය තත්ව ප්‍රකාශයේ දැක්වෙන ශුද්ධ වටිනාකම ශුද්ධ පදනමින් නිරවුල් කිරීමට හෝ එකවිටම වත්කම් අත්කර ගැනීමට හා වගකීම් නිරවුල් කිරීමට සමාගමට නීත්‍යානුකූල අයිතියක් ඇත.

**අ. ණය සහ ලැබිය යුතු දෑ**

ණය සහ ලැබිය යුතු දෑ යනු සක්‍රිය වෙළඳපළ තුළ අප්‍රකාශිත ස්ථිර හෝ නිශ්චයනීය ගෙවීම් සහිත මූල්‍ය වත්කම් ය. ආරම්භයේ දී එවැනි වත්කම් සාධාරණ අගය මත සහ අනෙකුත් සෘජු ලෙස දායකවන සියලුම පිරිවැය මඟින් හඳුනාගනු ලැබේ. ඉන් අනතුරුව ණය සහ ලැබිය යුතු දෑ ඵලදායී පොළී ක්‍රමය අනුව හානිකරණ පාඩු ඇත්නම් අඩුකර ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කරනු ලැබේ.

ණය සහ ලැබිය යුතු දෑ යටතට පහත දෑ අයත් වේ.

i. වෙළෙඳ කටයුතුවලින් ලැබිය යුතු දෑ

ලැබිය යුතු බොල් ණය හා අවිනිශ්චිත දෑ වෙනුවෙන් වෙන් කළ ප්‍රතිපාදනවල ශුද්ධ මුදල අය කර ගැනීම සඳහා ඇස්තමේන්තු කරන ප්‍රමාණවලින් වෙළෙඳ හා වෙනත් ලැබිය යුතු දෑ ප්‍රකාශ කරනු ලැබේ. ලැබිය යුතු දෑ සම්බන්ධ මුල් කොන්දේසිවලට අනුව සමාගමට ලැබිය යුතු සියල්ල අයකර ගැනීමට නොහැකි බවට වාස්තවික සාක්ෂ්‍ය පවතින විට අවිනිශ්චිත ණය වෙනුවෙන් ප්‍රතිපාදනයක් වෙන් කරනු ලැබේ. බොල් ණය හඳුනා ගත් විට කපා හරිනු ලැබේ.

### 3.4 ඉන්වෙන්ට්‍රි

පිරිවැය හා අයකර ගතහැකි වටිනාකම අතරින් අඩු අගයට අනුව ඉන්වෙන්ට්‍රි අගය කරනු ලැබේ. නිමැවුම් භාණ්ඩ ලේඛණ හා නිම නොකළ වැඩ පිළිබඳ සළකා බැලූ විට සාමාන්‍ය මෙහෙයුම් ධාරිතාව මත පදනම් වෙමින්, නිෂ්පාදන පොදු කාර්යයවල යෝග්‍ය අනුපාතිකයක් වියදමට ඇතුළත් වේ. ශුද්ධ අයකරගත හැකි වටිනාකම යනු ව්‍යාපාරයේ සාමාන්‍ය ක්‍රියාකාරීත්වය තුළ ඇස්තමේන්තුගත විකුණුම් මිලෙන්, ඇස්තමේන්තුගත වැඩ අවසන් කිරීමේ වියදම් හා විකුණුම් පිරිවැය අඩු කළ විට ලැබෙන අගය වේ.

ඉන්වෙන්ට්‍රි ඒවායේ වත්මන් තත්ත්වයට හා දැනට පවතින ස්ථානයට ගෙන ඒමට වැය වන වියදම පහත දැක්වෙන සූත්‍රයට අනුව ගණනය කරනු ලැබේ.

යෙදවුම් ද්‍රව්‍ය, අමතර කොටස් හා පාරිභෝගික ද්‍රව්‍ය - බර තැබූ සාමාන්‍ය පදනමින් සත්‍ය වියදම් ලෙස

# ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම

## මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

නිෂ්පාදිත භාණ්ඩ සහ නොනිමි නිෂ්පාදන (සීනි) - ඍජු අමුද්‍රව්‍ය, හා ඍජු ශ්‍රම වියදම හා නිෂ්පාදන පොදු කාර්යය පිරිවැයේ යෝග්‍ය අනුපාතිකයන්ගෙන් අතුරු නිෂ්පාදන (මොලෑෂස්) වල විකුණුම් මිල අඩුකිරීමෙන් මොලෑෂස්වල වටිනාකම විකුණුම් මිල අනුව ගණනය කෙරේ.

### 3.5 මූල්‍යමය වගකීම්

ආරම්භයේ දී, ණය සුරැකුම් සහ ණය හා ණයට ගැනීම් ඒවා ආරම්භ කළ දිනයන්ට අනුව සමාගම විසින් හඳුනා ගනී. අනෙකුත් සියලු මූල්‍යමය වගකීම්, ආරම්භයේ දී ගනුදෙනු කළ දිනට අනුව හඳුනා ගනී. සමාගම මූල්‍ය මෙවළම්වල එකඟතා විධිවිධානවල පාර්ශ්වයක් බවට පත්වන දිනය එම දිනය වේ. ගිවිසිගත බැඳීම් අත්හළ, අවලංගු කළ හෝ කල් ඉකුත් වූ මූල්‍යමය වගකීම් - සමාගම විසින් ගණනය කිරීම් සඳහා හඳුනා නොගනී.

ව්‍යුත්පන්න නොවන වගකීම් වෙනත් මූල්‍යමය වගකීම් ලෙස සමාගම විසින් වර්ග කරනු ලැබේ. එවැනි මූල්‍යමය වගකීම්, මුල දී සාධාරණ අගයට, අදාළ අනෙකුත් ඍජු ගනුදෙනු වල වියදම් එකතු කිරීමෙන් ගණනය කරනු ලැබේ. ඉන් අනතුරුව, සඵල පොළී අනුපාතික ක්‍රමය යටතේ, ක්‍රමක්ෂය පිරිවැය ලෙස මෙම මූල්‍යමය වගකීම් ගණනය කරනු ලැබේ. වෙනත් මූල්‍යමය වගකීම්වලට ණය හා ණය ගැනීම්, බැංකු අයිරා සහ නිකුත් කළ ණයකර ඇතුළත් වේ.

### 3.5.1 වෙනත් වගකීම් හා ප්‍රතිපාදන

#### 3.5.1.1 පොදු

මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කළ වගකීම් යනු ඉල්ලා සිටින විට දී මූල්‍ය තත්ත්ව ප්‍රකාශය ප්‍රකාශයට පත් කළ දිනයේ සිට වසරක් තුළ ගෙවිය යුතු වගකීම්ය. ජංගම නොවන වගකීම් යනු, මූල්‍ය තත්ත්ව ප්‍රකාශය ප්‍රකාශයට පත් කරන දින සිට වසරකට පසු ගෙවිය යුතු ශේෂයයි. මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ දී හඳුනා ගනු ලැබූ සියලුම වගකීම් ගණනය කරනු ලැබේ. අතීත සිද්ධීන්වල ප්‍රතිඵලයක් ලෙස සමාගමට/ සමූහ ව්‍යාපාරයට නීත්‍යානුකූල හෝ සම්ප්‍රයුක්ත බැඳීමක් පවතින විට ප්‍රතිපාදන හා වගකීම් ගණනය කරනු ලබන අතර, එකී බැඳීම් නිරවුල් කිරීම සඳහා ආර්ථික ප්‍රතිලාභ වැයකළ යුතු වේ.

### 3.5.2 සේවක ප්‍රතිලාභ

#### 3.5.2.1 නිශ්චිත දායකත්ව සැලසුම්

නිශ්චිත දායකත්ව සැලස්මක් යනු, පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ සැලැස්මක් වන අතර ඒ යටතේ යම් ආයතනයක් වෙනත් ආයතනයක් වෙත ස්ථිර දායකත්වයක් ගෙවනු ලබන නමුත් තවදුරටත් ගෙවීම් කිරීම සඳහා නීත්‍යානුකූල හෝ සාධනීය බැඳීමක් නොපවතී. නිශ්චිත දායකත්ව සැලසුම්වලට බැර කරනු ලබන අදාළ දායකත්වයන් මඟින් සේවක අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාරත්ව අරමුදලට සුදුසුකම් ලබන සියලුම සේවකයන් ආවරණය කරනු ලබන අතර අවශ්‍ය විට දී ඒවා මූල්‍ය ප්‍රකාශවල වියදමක් ලෙස හඳුනා ගනු ලැබේ.

#### 3.5.2.2 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්

නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මක් යනු, නිශ්චිත දායකත්ව සැලස්මක මෙන් ම පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ සැලැස්මකි. වාර්තා කරන දිනට, නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශවල හඳුනා ගන්නා වගකීම් නිශ්චිත ප්‍රතිලාභ බැඳීමේ වර්තමාන අගය වේ. නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් වාර්තා කරන දිනට ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 19 මඟින් නිර්දේශ කර ඇති පරිදි ඒකක ණය ක්‍රමයට අනුව සුදුසුකම් ලත් ආයුගණකවරයෙකු විසින් සිදු කරනු ලැබේ. සෑම වසරකදීම ආයුගණක තක්සේරු සිදු කිරීමට සමාගම බලාපොරොත්තු වේ.

නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්වල වත්මන් අගය නිර්ණය කරනු ලබන්නේ, ප්‍රතිලාභ සම්බන්ධයෙන් ගෙවීම් කරනු ලබන මුදල්වලට අදාළ පොළී අනුපාතික භාවිතයෙන් වගකීම් කාලසීමාවලට දළ වශයෙන් සමාන වන පරිනත වීමේ කාල සීමා සහිත අනාගත මූල්‍ය ප්‍රවාහ වට්ටම් කිරීමෙනි. මූල්‍ය ප්‍රකාශවල සියලුම සේවකයන්ගේ සේවා කාලයේ පළමු වසරේ සිට විශ්‍රාම පාරිතෝෂික ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන මූල්‍ය ප්‍රකාශ තුළින් සලසා තිබේ.

කෙසේ නමුත් 1983 අංක 12 දරන විශ්‍රාම පාරිතෝෂික පනත යටතේ සේවකයෙකුට ගෙවීම් සිදු කිරීමේ වගකීම එළඹෙන්නේ වසර පහක අඛණ්ඩ සේවය සම්පූර්ණ කළ විට පමණි. මෙම වගකීම සඳහා බාහිර ප්‍රභවයකින් අරමුදල් සම්පාදනය කර නොමැත. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 19 අනුගමනය කරමින් නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් නිසා පැණ නගින සියලු ආයුගණක ලාභ හා පාඩු ඒවා පැණ නැගුනු වහාම අනෙකුත් විස්තීර්ණ ආදායම් තුළින් ඉතා ඉක්මණින් හඳුනා ගනී. මෙය නැවත සලකා බැලීමේ බලපෑම සහිතව සමාගම විසින් සම්මත කර ඇත.

### 3.5.2.3 කෙටි කාලීන ප්‍රතිලාභ

කෙටි කාලීන සේවක ප්‍රතිලාභ හා බැදීම් වට්ටම් නොකර ගණනය කරනු ලබන අතර, අදාළ සේවාවන් ලබා දෙන විට වැය කරනු ලැබේ.

## 3.6 ප්‍රතිපාදන

අතීත සිද්ධියක ප්‍රතිඵලයක් වශයෙන් හට ගැනෙන, විශ්වසනීය ලෙස ඇස්තමේන්තුගත කළ හැකි නෛතික හෝ සම්මුතික බැඳීමක් පවතී නම් එය ප්‍රතිපාදනයක් ලෙස හඳුනා ගන්නා අතර, එකී බැඳීම නිරවුල් කිරීම සඳහා ආර්ථික ප්‍රතිලාභ වැය කිරීමට අවශ්‍ය විය හැක.

## 3.7 අයභාරය

ආයතනයේ ශුද්ධ අයභාරයේ පිරිවැටුම් බදු සහ වෙළඳ වට්ටම් ඉවත් කර ඇත. දළ අයභාරය මඟින් සමාගමේ බාහිර ගනුදෙනුකරුවන්ට ලබා දෙන භාණ්ඩ හා සේවාවන්වල බිල්පත් වටිනාකම නිරූපනය වේ.

### 3.7.1 ආදායම් හඳුනාගැනීම

සමාගම වෙත ගලා එන බවට සහතික වන ආර්ථික ප්‍රතිලාභ ප්‍රමාණය, අයභාරය හා ඒ ආශ්‍රිත පිරිවැය විශ්වාසනීය අන්දමින් මිණිය හැකි ප්‍රමාණය අනුව අයභාරය හඳුනාගනු ලැබේ. සමාගම වෙත ලැබුණු හා ලැබිය යුතු දේවල සාධාරණ අගය, වෙළඳ වට්ටම් හා එකතු කළ අගය මත බදුවල ශුද්ධ අගය හා සමාගමේ විකුණුම්වල ශුද්ධ අගය අනුව අයභාරය ගණනය කරනු ලැබේ.

**අ) භාණ්ඩ අලෙවිය**

සාමාන්‍ය ක්‍රියාකාරීත්වය තුල දී භාණ්ඩ අලෙවියෙන් ලැබෙන අයභාරය සමාගම වෙත ලැබුනු හා ලැබිය යුතු දේ වල සාධාරණ අගය, ශුද්ධ ලැබීම්, වෙළඳ වට්ටම් හා තොග අඩු කිරීම් මඟින් ගණනය කරනු ලැබේ. අයභාරය හඳුනාගනු ලබන්නේ සුවිශේෂ අවදානම් හා ලැබීම් වල අයිතිය ගනුදෙනුකරුවන් වෙත පවරා දී ඇති බව, අදාළ කාරණය සම්බන්ධයෙන් අයකරගැනීම් සිදු කළ හැකි බව, භාණ්ඩ ආශ්‍රිත පිරිවැය හා ඒවායේ අනාගත ලැබීම් විශ්වසනීය ලෙස ඇස්තමේන්තු ගත කළ හැකි වූ භාණ්ඩ සම්බන්ධයෙන් තවදුරටත් කළමණාකාරීත්වයේ මැදිහත් වීමක් නොමැති බව සහ අයභාරයේ ප්‍රමාණය විශ්වසනීය ලෙස මිණිය හැකි බව යනාදිය පිලිබඳව ක්‍රියාත්මක වෙළෙඳ ගිවිසුමක ස්වරූපයෙන් යුතුව විශ්වාසදායක සාක්ෂි පවතින විටදීය.

## 3.8 වෙනත් ආදායම්

ආයුගණක පදනමින් වෙනත් ආදායම් හඳුනා ගැනේ.

**අ) සමූහ ව්‍යාපාරය සතුව තිබූ දේපළ, පිරියත හා උපකරණ බැහැර කිරීම්වලින් ලද ලාභ/ පාඩු**

දේපළ පිරියත හා උපකරණ හා අනෙකුත් ජංගම නොවන වත්කම් බැහැර කිරීමෙන් ලද ලැබීම්, එම වත්කම්වල ධාරණ ප්‍රමාණ බැහැර කිරීම සඳහා කළ විකුණුම් හා ඒ ආශ්‍රිත අනෙකුත් වියදම් අඩුකර ලාභාලාභ ප්‍රකාශයේ සඳහන් කර ඇත. නැවත වටිනාකම තක්සේරු කළ දේපළ පිරියත හා උපකරණ බැහැර කිරීමේ දී එම වගකීමට අදාළ ශේෂය නැවත තක්සේරු කිරීමේ දී ඉතිරිව පවතින ප්‍රමාණය ඍජුව ම රඳවාගත් ඉපැයුම් වලට පැවරේ.

**ආ) ගොවි ණයවලින් ලද පොළී ආදායම**

ගොවීන්ට ලබාදුන් ණයවලින් ලැබෙන පොළී ආදායම, ලාභාලාභ ප්‍රකාශයේ හා අනෙකුත් විස්තීරණ ආදායම් ප්‍රකාශයේ උපචිත පදනමින් හඳුනා ගනු ලැබේ.

## 3.9 මූල්‍යමය ආදායම

අයකර ගැනීමේ හැකියාව සැකසහිත නොවේ නම් කාලීන පදනම මත (වත්කම මත සඵල ආදායම සැලකිල්ලට ගනිමින්) උපචිත පොළිය ලෙස මූල්‍යමය ආදායම හඳුනාගනු ලැබේ.

## 3.10 වියදම් හඳුනාගැනීම

විශේෂිත ආදායම් අයිතමවල ඉපැයීම් හා දැරිය යුතු වියදම අතර ඍජු සබඳතාවක් පවතින බවට සලකා ලාභාලාභ ප්‍රකාශයේ වියදම් හඳුනා ගනු ලැබේ. සමාගම ක්‍රියාත්මක වීමේ දී හා දේපළ පිරියත හා උපකරණ කාර්යක්ෂම ලෙස ක්‍රියා කරන පරිදි නඩත්තු කිරීමේ දී දැරිය යුතු පිරිවැය ලාභ ලබන වර්ෂයක් බවට පත් වීමේ දී ආදායමෙන් බැර කර ඇත. ලාභාලාභ ප්‍රකාශ ඉදිරිපත් කිරීම සඳහා පිරිවැය ක්‍රමයේ ශ්‍රිතය මඟින් සමාගමේ කාර්යසාධන මූලිකාංග පිළිබඳ සාධාරණ ඉදිරිපත් කිරීමක් නියෝජනය වන බව අධ්‍යක්ෂකවරුන්ගේ මතය වන අතර එබැවින් එම ඉදිරිපත් කිරීමේ ක්‍රම භාවිතා කර ඇත.

ප්‍රාරම්භක හා පූර්ව මෙහෙයුම් පිරිවැය ලාභාලාභ ප්‍රකාශයේ හඳුනාගෙන ඇත. අලුත්වැඩියා කිරීම් හා නවීකරණය කිරීම් වසරේ වියදම් සඳහන් කරනු ලබන විස්තීරණ ආදායම් ප්‍රකාශයට බැර කරනු ලැබේ.

## 3.11 බදු වියදම්

බදු වියදම් සමන්විත වන්නේ ජංගම, විලම්භිත හා අනෙකුත් ව්‍යවස්ථාපිත බදු වලිනි. හිමිකම් වෙනස්වීම් පිලිබඳ ප්‍රකාශය මඟින් ඍජුව හඳුනාගන්නා අයිතමවලට සම්බන්ධ වන බදු වියදම් ප්‍රමාණය හැරුණු කොට, විස්තීරණ ආදායම් ප්‍රකාශය මඟින් බදු වියදම් හඳුනා ගැනේ.

### 3.11.1 ජංගම බදු

ජංගම බදු යනු, වාර්තා කරන දිනට, ප්‍රඥප්ත හෝ උපයෝගී ප්‍රඥප්ත බදු අනුපාතිකවලට අනුව වර්ෂය සඳහා බදු ගෙවිය යුතු ආදායම හෝ පාඩුව වෙනුවෙන් ගෙවීමට හෝ ලැබීමට අපේක්ෂිත බදුය. ආදායම් බදු සඳහා ප්‍රතිපාදන පදනම් වන්නේ මූල්‍ය ප්‍රකාශවල වාර්තා වන ආකාරයට සහ 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ ප්‍රතිපාදනවලට අනුව ගණනය කරන ආකාරයට ආදායම් හා වියදම් මූලිකාංග මත ය.

වර්තමාන හා ඊට පෙර කාලසීමාවන් සඳහා ජංගම බදු වත්කම් හා වගකීම් දේශීය ආදායම් කොමසාරිස් ජෙනරාල් වෙත ගෙවිය යුතු හෝ/වෙතින් අයකර ගැනීමට අපේක්ෂිත ප්‍රමාණ ලෙස ගණනය කරනු ලැබේ.

### 3.11.2 විලම්භිත බදු

විලම්භිත බදු හඳුනාගනු ලබන්නේ මූල්‍ය වාර්තාකරණ අවශ්‍යතා හෝ බදුකරන අවශ්‍යතා සඳහා වත්කම් හා වගකීම්වල ඉදිරියට ගෙන ආ පිරිවැය ප්‍රමාණ අතර තාවකාලික හිඟ ප්‍රමාණ ලබා දීම සඳහා ශේෂපත්‍ර ක්‍රමය භාවිතයෙනි. තාවකාලික හිඟ ප්‍රමාණවලට අදාළ වන අනුපාතිකවලට අනුව විලම්භිත බදු ගණනය කරනු ලැබේ.

හඳුනාගත් විලම්භිත බදු වගකීමට වඩා ඉදිරියට ගෙනා බදු පාඩු වැඩි නම් මූල්‍ය ප්‍රකාශ මඟින් විලම්භිත බදු වගකීම් හඳුනාගනු නොලැබේ.

## 3.12 කොටසකට ඉපැයුම්/ (පාඩුව)

සමාගම විසින් සාමාන්‍ය කොටස් සඳහා කොටසකට මූලික ඉපැයුම (EPS) ඉදිරිපත් කරයි. සමාගමේ සාමාන්‍ය කොටස් හිමිකරුවන්ට ලැබිය යුතු ලාභය හෝ පාඩුව අදාළ කාල සීමාව තුළ හිඟව පවතින බරතැබූ සාමාන්‍ය කොටස් සංඛ්‍යාවෙන් බෙදීමෙන් EPS ගණනය කරනු ලැබේ.

## 4. වාර්තා කරන දිනට නිකුත් කළ නමුත් බල නොපැවැත්වෙන නව ගිණුම්කරණ ප්‍රමිති

මෙම ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී වාර්තා කරන දින වන වන විට නිකුත් කර ඇති නමුත් බලාත්මක නොවන ප්‍රමිති සංශෝධන ගණනාවක් භාවිත කර නොමැත. ඒ අනුව, මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී පහත සඳහන් ගිණුම්කරණ ප්‍රමිතීන් අදාළ කර නොමැති අතර සමාගම විසින් එකී ප්‍රමිති ඒවා බලාත්මක වන දිනයන්හිදී භාවිතා කිරීමට සැලසුම් කරයි.

**ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති - 9 - මූල්‍ය මෙවලම්**

2014 ජූලි මස නිකුත් කළ එස් එල් එෆ් ආර් එස් (SLFRS) 9, 2018 ජනවාරි 01 දින හෝ ඊට පසු එළඹෙන වාර්ෂික කාලසීමාවන් සඳහා බලාත්මක වන අතර ඊට ප්‍රථම භාවිතය සඳහා අවසර ඇත. එමගින් එල් කේ ඒ එස් (LKAS) 39 –'මූල්‍ය මෙවලම්- හඳුනාගැනීම හා මැනීම' ප්‍රතිස්ථාපනය කර ඇත. 2014 ජූලි මස එස් එල් එෆ් ආර් එස් 9 නිකුත් කර ඇති බැවින්, සංක්‍රාන්ති විධිවිධාන මත පදනම්ව සමාගම එය 2018 ජනවාරි 01 දින සිට භාවිතා කරයි.

බාහිර උපදේශකයෙකුගේ සහාය ඇතිව SLFRS 9 සම්මත කර ගැනීම සම්බන්ධයෙන් 2017 මාර්තු 31 දින වන විට සමාගම පරතර විශ්ලේෂණය සහ ප්‍රමාණකරණය සහ එහි මූල්‍ය ප්‍රකාශනවල සිදු කරන ලද ප්‍රසමාගම මේ වන විට, ආරම්භක බලපෑම් තක්සේරුව ගණනය කිරීම සඳහා භාවිතා කළ දත්ත සහ ආකෘති පරීක්ෂා කිරීම සහ පිරිපහදු කිරීමේ නියැලී සිටියි. මාණාකරන මත පදනම්ව සංක්‍රාන්තිය කෙරෙහි ඇති බලපෑම තක්සේරු කර ඇත.

එස් එල් එෆ් ආර් එස් 9 හි ප්‍රධාන කොටස් තුනක් ඇතුළත් වේ. එනම්;

- **මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් වර්ගීකරණය හා ගණනය කිරීම**
- **මූල්‍ය වත්කම් හානිකරණය**
- **හෙජ් ගිණුම්කරණය**

**❖ මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් වර්ගීකරණය හා ගණනය කිරීම**

වත්කම් කළමනාකරණය කරන ව්‍යාපාර ආකෘතිය සහ ඒවායේ මුදල් ප්‍රවාහ ලක්ෂණ පිළිබිඹු කරන මූල්‍ය වත්කම් සඳහා නව වර්ගීකරණ හා මිනුම් ප්‍රවේශයක් SLFRS 9 හි අඩංගු වේ. SLFRS 9 හි මූල්‍ය වත්කම් සඳහා මූලික වර්ගීකරණ කාණ්ඩ තුනක් ඇතුළත් වේ; ක්‍රමක්ෂය පිරිවැය අනුව ගණනය කරනු ලැබීම, අනෙකුත් විස්තීර්ණ අදායම් තුලින් සාධාරණ වටිනාකම (FVOCI) සහ ලාභ හා අලාභ හරහා සාධාරණ වටිනාකම (FVTPL). එය වෙළඳාම සඳහා රඳවා ගත්, කල්පිරීමේ ණය සහ ලැබිය යුතු දේ සහ විකිණීමට තිබෙන දේ වෙනුවෙන් රඳවා ගත් LKAS 39 කාණ්ඩ ඉවත් කරයි.

සියළුම කොටස් මෙවලම් ලාභ හෝ අලාභ හෝ වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ වටිනාකමක් ලබා ගත යුතුය. වෙනත් විස්තීර්ණ ආදායම් හරහා සාධාරණ වටිනාකම යනු යළි සකස් නොකර නැවත ලබා ගත නොහැකි විකල්පයකි. (එනම් වෙනත් විස්තීර්ණ ආදායම්වල / සංචිතවල හඳුනාගෙන ඇති ප්‍රමාණය (මුදල) බැහැර කරන අවස්ථාවේ දී පී සහ එල් (P&L) වෙත මාරු කළ නොහැක).

2018 ජනවාරි 1 දිනට පවතින මූල්‍ය වත්කම් වර්ගීකරණය සහ ගණනය කිරීම සඳහා ප්‍රමිතිය බලපානු ඇත.

- ✓ වෙළඳාම සඳහා රඳවා ගත් සහ LKAS 39 යටතේ FVTPL මනිනු ලැබූ බවට වර්ගීකරණය කර ඇති අතර අවදානම් කළමනාකරණය සඳහා රඳවා ගත් වෙළඳ වත්කම් සහ ව්‍යුත්පන්නයන්, SLFRS 9 යටතේ FVTPL අනුව ද ගණනය කරනු ලැබේ.
- ✓ ණය සහ ලැබිය යුතු දේ ලෙස වර්ගීකරණය කළ සහ LKAS 39 යටතේ ක්‍රමක්ෂය පිරිවැය අනුව ගණනය කරනු ලබන, බැංකුවලට සහ ගනුදෙනුකරුවන්ට ලබා දෙන ණය සහ අත්තිකාරම් පොදුවේ SLFRS 9 යටතේ ක්‍රමක්ෂය පිරිවැය අනුව ද ගණනය කරනු ලැබේ.
- ✓ LKAS 39 යටතේ ක්‍රමක්ෂය පිරිවැය අනුව ගණනය කරනු ලබන කල් පිරෙන ආයෝජන සුරකුම්පත් සාමාන්‍යයෙන් SLFRS 9 යටතේ ක්‍රමක්ෂය පිරිවැය අනුව ද ගණනය කරනු ලැබේ.
- ✓ LKAS 39 යටතේ විකිණීම සඳහා පවතින බවට වර්ගීකරණය කර ඇති ණය ආයෝජන සුරැකුම්පත්, SLFRS 9 යටතේ, විශේෂිත තත්වයන් මත පදනම්ව, ක්‍රමක්ෂය පිරිවැය, FVOCI හෝ FVTPL අනුව ගණනය කළ හැකිය.

## <u>ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම</u>
## <u>මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන්</u>

- ✓ LKAS 39 යටතේ විකිණීම සඳහා පවතින බවට වර්ගීකරණය කර ඇති කොටස් ආයෝජන සුරැකුම්පත් 2018 ජනවාරි 1 වන දින FVOCI ලෙස නම් කෙරේ.

කිසියම් කොන්දේසියක් වර්ගීකරණයේ වෙනසක් ඇති කරයිද යන්න තක්සේරු කිරීම සඳහා සමාගම ණය ගිවිසුම සහ වත්කම් එකතුවේ අරමුණු සමාලෝචනය කර ඇත. කෙසේ වෙතත්, සිදු කරන ලද බලපෑම් විශ්ලේෂණයන් මත පදනම්ව සමාගමේ වර්තමාන මිනුම් නීතිවල සැලකිය යුතු වෙනස්කම් සමාගම විසින් හඳුනාගෙන නොමැත. SLFRS 9, මූල්‍ය වගකීම් මැනීමේ නීති රීති සහිත යි.

❖ **මූල්‍ය වත්කම් හානිකරණය**

SLFRS 9 මගින් LKAS 39 හි භාවිත කරන ලද සිදු වූ අලාභයට එරෙහිව අපේක්ෂිත අලාභය පිළිබඳ මූලධර්මයට අදාළ සංකල්පය ගෙන එයි.

ඒ අනුව;

අ) සියළුම ණය සඳහා ආයු කාලය තුල අපේක්ෂිත ණය පාඩු (ECL) ලබා දෙනු ඇත. කෙසේ වෙතත්, ණයවල ණය අවදානම ප්‍රදාන දිනයේ සිට සැලකිය යුතු ලෙස වැඩි වී නොමැති නම්, අපේක්ෂිත අලාභය මාස 12 ක කාල සීමාවකට පමණක් සීමා කළ යුතු ය.

ආ) මෙම ප්‍රතිපාදනය LKAS 39 යටතේ භාවිතා වන හිඟ ශේෂය වෙනුවට ගෙවීමට අපොහොසත් වීමට නිරාවරණය වීම (ඊ ඒ ඩී) මත පදනම් විය යුතුය. එහි ප්‍රතිඵලයක් ලෙස, නොගෙවූ ණය බැඳීම්/භාවිතයට නොගත් ණය පහසුකම් ප්‍රතිපාදන ආකර්ෂණය කර ගනු ඇත.

ඇ) පහත සඳහන් අලාභ සංඛ්‍යාලේඛනවල අභ්‍යන්තර ඇස්තමේන්තු මගින් අපේක්ෂිත අලාභය මැනිය හැකි ය.

- ❖ ඒජ් බකට් සංක්‍රාන්ති අනුකෘතිය හරහා ලබාගත් ගෙවීමට අපොහසත් වීමේ සම්භාවිතාව (පී ඩී)
- ❖ පැහැර හරින ලද ණයවල ඓතිහාසික අයකර ගැනීම් මත පදනම්ව පාඩු ලබා දී ඇති ණය ගෙවීම් පැහැර හැරීම් (එල් ජී ඩී )

ඇ) බැංකුව විසින් ගණනය කරන ලද අලාභ සංඛ්‍යාලේඛන සකස් කිරීම සඳහා ඉදිරි දැක්ම පිළිබඳ තොරතුරු ඇතුළත් කර යි. මෙම ඉදිරි දැක්ම පිළිබඳ තොරතුරු අතර දළ දේශීය නිෂ්පාදනය, උද්ධමනය වැනි සාර්ව ආර්ථික සාධක ඇතුළත් වේ.

ඉ) SLFRS 9 සඳහා විදේශ මුදල්වලින් නම් කරන ලද රජයේ සුරැකුම්පත් සහ ආයතනික ණයකර ඇතුළු සියලු මූල්‍ය වත්කම් සඳහා ප්‍රතිපාදන සැපයිය යුතුය.

❖ **හෙජ් ගිණුම්කරණය**

SLFRS 9 මගින් නියම කර ඇති හෙජ් ගිණුම්කරණ මාර්ගෝපදේශයන් සමාගම තුළ දැනට ක්‍රියාත්මක වන මුදල් ප්‍රවාහ හෙජ් ගිණුම්කරණයට කිසිදු බලපෑමක් ඇති නොකරයි.

### SLFRS 15 - ගනුදෙනුකරුවන් සමඟ ඇති ගිවිසුම් වලින් ආදායම

ආදායම හඳුනාගෙන තිබේද, කොපමණද, කවදාද යන්න තීරණය කිරීම සඳහා SLFRS 15 පුළුල් රාමුවක් ස්ථාපිත කරයි. නව ගුණාත්මක හා ප්‍රමාණාත්මක අනාවරණ අවශ්‍යතා මගින් මූල්‍ය ප්‍රකාශන භාවිතා කරන්නන්ට ගනුදෙනුකරුවන් සමඟ ඇති ගිවිසුම් වලින් පැන නගින ආදායමේ ස්වභාවය, ප්‍රමාණය, වේලාව සහ අනාරක්ෂිත බව සහ මුදල් ප්‍රවාහයන් අවබෝධ කර ගැනීමට හැකි වේ. ආදායම පිළිබඳ LKAS 18 සහ ඉදිකිරීම් කොන්ත්‍රාත්තු සඳහා LKAS 11 සහ පාරිභෝගික ලැදියා වැඩසටහන් සඳහා IPRIC 13 ඇතුළුව පවත්නා ආදායම් හඳුනාගැනීමේ මාර්ගෝපදේශය එය ප්‍රතිස්ථාපනය කරයි.

ආදායම හඳුනාගත යුත්තේ කවදාද එසේත් නැත්නම් ආයතනයක් විසින් භාණ්ඩ හා සේවාවන් පාලනය කිරීම පාරිභෝගිකයෙකුට ලැබිය යුතු යැයි එම ආයතනය අපේක්ෂා කරන ප්‍රමාණයට පවරන නිසා යන බව ආකෘතිය මගින් දක්වා ඇත.

ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම
මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන්

SLFRS 15 2018 ජනවාරි 01 වන දින හෝ ඊට පසුව ආරම්භ වන වාර්ෂික වාර්තාකරණ කාල සීමාවන් සඳහා බලපැවැත්වෙන අතර ඊට ප්‍රථම භාවිතය සඳහා අවසර ඇත.

SLFRS 15 භාවිත කිරීම හේතුවෙන් සිය මූල්‍ය ප්‍රකාශන කෙරෙහි සැලකිය යුතු බලපෑමක් වනු ඇතැයි සමාගම අපේක්ෂා නොකරණ අතර සවිස්තරාත්මක සමාලෝචනය සම්පූර්ණ කිරීමට ඉතිරිව ඇති බැවින්, මෙම මූල්‍ය ප්‍රකාශන ප්‍රකාශයට පත් කරන දිනට මූල්‍යමය බලපෑම සාධාරණ ලෙස තක්සේරු කළ නොහැක.

**SLFRS 16 – 'කල්බදු'**

SLFRS 16 හි බදු ගෙවන්නන් විසින් ඔවුන්ගේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ සියළුම කල්බදු, කල්බදු වගකීම් ලෙස හඳුනා ගැනීමට අවශ්‍ය වේ.

පිළිගත් කල්බදු සඳහා ලාභ හෝ අලාභ හඳුනාගැනීමේ රටාව පවත්නා මූල්‍ය කල්බදු ගිණුම්කරණයට සමාන වන අතර පොළී සහ ක්ෂයවීම් වියදම් වෙන වෙනම ලාභය හෝ අලාභය ලෙස හඳුනාගෙන ඇත.

SLFRS 16 2019 ජනවාරි 1 වන දින හෝ ඊට පසුව ආරම්භ වන වාර්ෂික කාල පරිච්ඡේද සඳහා ක්‍රියාත්මක වේ.

සිදු කරන ලද ඉහළ මට්ටමේ බලපෑම් තක්සේරුව මත පදනම්ව, මෙහෙයුම් කල්බදු ගිවිසුම් ප්‍රාග්ධනීකරණය කිරීම හැර SLFRS 16 භාවිතයෙන් සැලකිය යුතු බලපෑමක් සමාගම අපේක්ෂා නොකරයි.

පහත සඳහන් සංශෝධන සහ වැඩිදියුණු කිරීම් සමාගමේ මූල්‍ය ප්‍රකාශන කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කරනු ඇතැයි අපේක්ෂා නොකෙරේ.

- SLFRS (2014-2016) චක්‍රය සඳහා වාර්ෂික වැඩිදියුණු කිරීම් - විවිධ ප්‍රමිතීන්
- LKAS 28 සඳහා සංශෝධන - සමාගමේ ආශ්‍රිතයන් සහ හවුල් ව්‍යාපාර කෙරෙහි දිගු කාලීන පොළී
- SLFRS 10 සහ LKAS 28 සඳහා සංශෝධන - ආයෝජකයෙකු සහ එහි ආශ්‍රිතයන් හෝ හවුල් ව්‍යාපාරයක් අතර වත්කම් විකිණීම හෝ දායක වීම
- SLFRS 2 සඳහා සංශෝධන - කොටස් පදනම් කරගත් ගෙවීම් ගනුදෙනු වර්ගීකරණය සහ ගණනය කිරීම
- IFRS 9 සඳහා සංශෝධන- සෘණ වන්දි සහිත පෙරගෙවුම් අංගයක් සහිත මූල්‍ය වත්කම්
- IFRIC 22 පිළිබඳ අතිරේක තොරතුරු - විදේශ මුදල් ගනුදෙනු සහ අත්තිකාරම් සලකා බැලීම්
- IFRIC 23 - ආදායම් බදු ප්‍රතිකාර පිළිබඳ අවිනිශ්චිතතාව
- SLFRS (2015-2017) චක්‍රය සඳහා වාර්ෂික වැඩිදියුණු කිරීම් - විවිධ ප්‍රමිතීන්

## ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම
## මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන්

### 5. ප්‍රවර්තන (අකණ්ඩ) ව්‍යාපාරයක් බවට උපකල්පනය කිරීමේ යෝග්‍ය බව

2018 මාර්තු 31 න් අවසන් වන වර්ෂයේදී සමාගම රු. 1,352,439,253/=ක පාඩුවක් දරන ලද අතර (ඊට පෙර වසරේදී පාඩුව රු. 956,794,464/= කි) එදින වන විට මුළු වත්කම් ඉක්මවා දැරූ වගකීම් ප්‍රමාණය රු. 4,417,401,944/= කි. (ඊට පෙර වසර සඳහා අගය රු. 3,064,962,691/=). මෙම තත්වයන් මගින් පෙන්නුම් කරන්නේ ප්‍රවර්තන (අකණ්ඩ) ව්‍යාපාරයක් ලෙස පැවතීමේ අවිනිශ්චිතභාවයයි.

කෙසේ නමුත් අනාගතයේ දී ධන මූල්‍ය ප්‍රවාහයක් මෙන්ම ලාභ උත්පාදනය කළ හැකි ක්‍රියාත්මක සැලැස්මක් සමාගම විසින් සකස්කර ඇති අතර එතෙක් දැරූ පාඩු පියවා ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එම සැලැස්මේ ප්‍රගතිය සමාලෝචනය කරනු ඇත. සැලසුම්ගත ස්කාගාරය වෙනුවෙන් ආයෝජනය කිරීම සහ උක් වගාවන් බලාපොරොත්තු වූ සක්‍යතා මට්ටම වෙත ලඟා වීම ඔස්සේ නිෂ්පාදනය ඉහළ නැංවීම මගින් අපේක්ෂිත ලාභ හා ධන මූල්‍ය ප්‍රවාහ අත්කර ගත හැකි වනු ඇත. සමාගමේ අඛණ්ඩභාවය පිළිබඳ තීරණය කිරීමේදී, සමාගම විසින් ලාභදායීතාවන් හා මූල්‍ය ප්‍රවාහ කෙරෙහි එමගින් ඇති කරන බලපෑම පිළිබඳව ඇගයීමට ලක්කර ඇත. ඒ අනුව සමාගමට ප්‍රවර්තන ව්‍යාපාරයක් ලෙස ක්‍රියාත්මක විය හැකි බව අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය වේ.

| | *මාර්තු 31න් අවසන් වර්ෂය සඳහා,* | **2018 (රු)** | 2017(රු) |
|---|---|---|---|
| 6 | **අයභාරය** | | |
| | සීනි අලෙවිය | **1,243,023,570** | 1,007,844,863 |
| | | **1,243,023,570** | 1,007,844,863 |
| 7 | **අනෙකුත් ආදායම්** | | |
| | පිරිසිදු නොකළ සීනි අලෙවි කිරීමෙන් ලද ආදායම | **10,735,666** | 8,499,377 |
| | මොලැසස් අලෙවි කිරීමෙන් ලද ශුද්ධ ආදායම | **5,397,533** | 5,173,837 |
| | ගොවි ණය වලින් ලද පොළී ආදායම | **25,188,403** | 25,174,679 |
| | ජලය අලෙවි කිරීමෙන් ලද ආදායම | **-** | - |
| | සුන්බුන් අබලි ද්‍රව්‍ය අලෙවි කිරීමෙන් ලද ආදායම | **-** | 1,741,899 |
| | වෙනත් විවිධ ආදයම් | **49,801** | 151,859 |
| | | **41,371,403** | 40,741,651 |
| 8 | **ශුද්ධ මූල්‍ය වියදම්** | | |
| 8.1 | **මූල්‍ය ආදායම්** | | |
| | පොළී ආදායම් - ප්‍රති ආයෝජන හා ඉතිරි කිරීම | **30,210** | 38,302 |
| | | **30,210** | 38,302 |
| 8.2 | **මූල්‍ය වියදම්** | | |
| | විවිධ ආයතන වෙතින් ණය සඳහා පොළිය | | |
| | ලංකා ඔරික්ස් ලීසිං සමාගම (පී.එල්.සී.) | **101,460,220** | 105,397,860 |
| | එල්ඕඑල්සී ෆැක්ටර්ස් සමාගම | **532,703,871** | 250,187,205 |
| | බ්‍රවුන්ස් සහ සමාගම (පී.එල්.සී.) | **111,632,714** | 117,353,256 |
| | කොමර්ෂල් ලීසිං සහ මූල්‍ය සමාගම (පී.එල්.සී.) | **49,581,017** | 38,123,289 |
| | ඇග් ස්ටාර් (පී.එල්.සී.) | **-** | - |
| | මහජන බැංකුව (පී.එල්.සී.) | **170,882** | 10,363,464 |
| | ලංකා බැංකුව (පී.එල්.සී.) | **8,412,381** | 18,449,454 |
| | සාක්‍යා කැපිටල් ප්‍රයිවට් ලිමිටඩ් | **287,499,996** | 171,901,825 |
| | කොමර්ෂල් ට්‍රස්ට් ටෙක්නොලොජීස් ප්‍රයිවට් ලිමිටඩ් | **36,903,730** | |
| | **වෙනත් පොළී** | | |
| | මූල්‍ය කල්බදු බැඳීම් මත පොලී | **40,340,964** | 18,937,979 |
| | බැංකු අයිරා මත පොළී | **24,813,987** | 16,702,149 |
| | | **1,193,519,762** | 747,416,480 |
| | **ශුද්ධ මූල්‍ය ආදායම්/වියදම්** | **(1,193,489,552)** | (747,378,178) |
